2016

වාර්ෂික වාර්තාව

EDB

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2018-02-28

ගරු මලික් සමරවික්‍රම
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය,
30 වෙනි මහළ, බටහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01.

ගරු ඇමතිතුමනි,

වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය - 2016

1971 අංක 38 දරණ මුදල් පනතේ 13(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2016 වසර සඳහා වන වාර්ෂික වාර්තාව සහ පහත සඳහන් ලියකියවිලි ඔබ වෙත සතුටින් පිළිගන්වමි.

- **සභාපතිනියගේ වාර්තාව**
- **ගිණුම් ප්‍රකාශය**
- **විගණකාධිපතිගේ වාර්තාව**

මෙයට- විශ්වාසී

ඉන්දිරා මල්වත්ත
සභාපතිනිය සහ ප්‍රධාන විධායක

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කාර්ය මණ්ඩලය 2016

සභාපතිනිය සහ ප්‍රධාන විධායක	- ඉන්දිරා මල්වත්ත මිය
අධ්‍යක්ෂ ජනරාල්	– ජේ. සිරිවර්ධන මිය (2016.10.01 සිට)
වැ.බ. අධ්‍යක්ෂ ජනරාල්	– හිමාලි ජිනදාස මිය (2015.06.25 සිට 2016.03.31 දක්වා) – ඩබ්.එම්.ආර්.පී.වීරසිංහ මයා (2016.04.28 සිට 2016.09.30 දක්වා)
විධායක අධ්‍යක්ෂ	– ආචාර්ය යූසුෆ් කේ. මරික්කාර් මහතා (2010.06.11 සිට 2016.06.10 දක්වා)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	– ආර්. එම් . පි. හේවාලියනගේ මිය මුදල් හා පාලන අංශය
මුදල් අංශය	– පි. කේ. සුමිත්‍රාරච්චි මිය අධ්‍යක්ෂිකා
මානව සම්පත් කළමණාකරණ අංශය	– කේ. කේ. ආර්. කන්නංගර මහතා අධ්‍යක්ෂ (2016.07.17 සිට) – ඒ.ජී.සී.කිරිඇල්ල මිය අධ්‍යක්ෂිකා (2016.07.16 දක්වා)
වෙළඳ පහසුකම් හා වෙළඳ තොරතුරු අංශය	– එස්. ආර්. පි. ඉන්ද්‍රකීර්ති මහතා අධ්‍යක්ෂ
තොරතුරු තාක්ෂණ අංශය	– අයි. සි. අලහප්පෙරුම මිය අධ්‍යක්ෂිකා (2016.04.28 සිට) – පි. වි. ඒ. එම්. බද්දේගමගේ මිය අධ්‍යක්ෂිකා (2016.04.27 දක්වා)
කෘෂි අපනයන අංශය	– පි. වි. ඒ. එම්. බද්දේගමගේ මිය අධ්‍යක්ෂිකා (2016.04.28 සිට) – එන්.එස්. නාරන්දෙණිය මිය වැ.බ. අධ්‍යක්ෂිකා (2016.04.27 දක්වා)
සුළු හා මධ්‍යම ව්‍යවසාය සංවර්ධන අංශය	– තිලක් දිල්හාන් අතපත්තු මහතා අධ්‍යක්ෂ (2016.05.16 සිට) – කේ.එම්.ආර්.පී.ප්‍රනාන්දු මයා වැ.බ. අධ්‍යක්ෂ (2016.05.15 දක්වා)

ප්‍රතිපත්ති හා සැලසුම් අංශය	– යූ.කේ.ඩී. වැගපිටිය මිය අධ්‍යක්ෂිකා
කාර්මික නිෂ්පාදන අංශය	– සී. දිසානායක මිය අධ්‍යක්ෂිකා
අපනයන සේවා අංශය	– එම්.කේ. එස්. කේ. මල්දෙනි මහතා අධ්‍යක්ෂ
විශේෂ ව්‍යාපෘති අංශය	– ඩී . ජයවර්ධන මහතා අධ්‍යක්ෂ
අලෙවි සංවර්ධන අංශය	– කේ. ඒ. වී. ප්‍රේමතිලක මිය අධ්‍යක්ෂිකා (2016.04.28 සිට) – අයි. සී. අලහප්පෙරුම මිය වැ.බ. අධ්‍යක්ෂිකා (2016.04.27 දක්වා)
අභ්‍යන්තර විගණන අංශය	– නිල්මිණී රණසිංහ මිය අභ්‍යන්තර විගණක (2016 අගෝස්තු සිට) – එන්. පී. ඇඳගම මිය වැ.බ. අභ්‍යන්තර විගණක (2016 අගෝස්තු දක්වා)
නීති අංශය	– ඩී.ටී. විජයරත්න මිය නීති නිළධාරිනී
විගණකවරු	– විගණකාධිපති
බැංකු කරුවන්	– ලංකා බැංකුව – සම්පත් බැංකුව – ජාතික සංවර්ධන බැංකුව

<u>ලියාපදිංචි කාර්යාලය</u>

අංක 42 ,නවම් මාවත

කොළඹ 02.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් - 2016

01.	ඉන්දිරා මල්වත්ත මිය	-	සභාපතිනිය
02.	ආචාර්ය යූසුෆ් කේ.මරික්කාර් මහතා	-	අධ්‍යක්ෂ
03.	බන්දුල එගොඩගේ මහතා	-	අධ්‍යක්ෂ
04.	සනත් ඩි සිල්වා මහතා	-	අධ්‍යක්ෂ
05.	එම්.ජේ.එෆ්. කසීම් මහතා	-	අධ්‍යක්ෂ
06.	රොහාන් අබේකෝන් මහතා	-	අධ්‍යක්ෂ
07.	සිනාන් සලහුදීන් මහතා	-	අධ්‍යක්ෂ
08.	එල්.පි.ජයම්පති මහතා	-	ලේකම් වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය
09.	ඩබ්.එම්.එම්.ආර්.අධිකාරි මිය	-	ලේකම් ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය අමාත්‍යාංශය
10.	එම්.අයි.එම්. රෆීක් මහතා	-	ලේකම් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
11.	පී.එම්.අනුර ඩි සිල්වා මහතා	-	රාජ්‍ය ලේකම් ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය
12.	ඩී.වී.බන්දුලසේන මහතා	-	ලේකම් කෘෂිකර්ම අමාත්‍යාංශය
13.	ඒ.කේ.සෙනෙවිරත්න මහතා	-	අතිරේක ලේකම් (ප්‍රතිපත්ති හා සැලසුම්) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය (2016 දෙසැම්බර් දක්වා)
14.	ෂෙයිතා සේනාරත්න මිය	-	අතිරේක ලේකම් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය (2016 දෙසැම්බර් සිට)
15.	යූ.කේ.එස්.මිහිඳුකුලසූරිය මහතා	-	අතිරේක ලේකම් (සංවර්ධන) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

16.	බන්දුල වික්‍රමාරච්චි මහතා	-	අතිරේක ලේකම් ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය (2016 සැප්තැම්බර් දක්වා)
17.	අංජලී දේවරාජා මෙය	-	අතිරේක ලේකම් ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය (2016 ඔක්තෝබර් සිට)
18.	ප්‍රියන්ත මායාදුන්නේ මහතා	-	අතිරේක ලේකම් ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය (2016 නොවැම්බර් දක්වා)
19.	එස්. සේනානායක මහතා	-	අතිරේක ලේකම් ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය (2016 දෙසැම්බර් සිට)
20.	ජී.ආසිරිවතම් මිය	-	අධ්‍යක්ෂ ජනරාල් (ආර්ථික කටයුතු) විදේශ කටයුතු අමාත්‍යාංශය
21.	පි.එච්.ඒ.එස්.විජේරත්න මහතා	-	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශය

පටුන

01	හැඳින්වීම	8
02	2016 වර්ෂයේ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය	9-27
03	2016.12.31 දිනට ශේෂ පත්‍රය	28
04	2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය	29
05	හිමිකම් ප්‍රකාශය	30
06	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	31
07	මූල්‍ය ප්‍රකාශන සටහන්	32-39
08	විගණන වාර්තාව	40-57

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය, අපනයන සංවර්ධන මණ්ඩලය වන අතර එය 1979 අංක 40 දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ පිහිටුවන ලදී. වර්ෂ 2020 දී ඇ.ඩො. බිලියන 20ක අපනයන ආදායමක් ලඟා කරගැනීමේ අරමුණින් සහ එමගින් රජයේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට දායකත්වය ලබාදීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීමෙහිලා නව උපාය මාර්ගික ප්‍රවේශයකට අවතීර්ණ වී ඇත. ජාතික අපනයන ඉලක්ක සපුරා ගැනීම සඳහා වන නව උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමෙහිලා, අපනයන සංවර්ධන මණ්ඩලය තම කාර්යභාරය 'ප්‍රතිපත්ති උපදේශක, 'අධීක්ෂක', 'ප්‍රවර්ධක', 'පහසුකම් සලසන්නා' සහ 'දැනුම සපයන්නා' යනාදී ලෙස සිය කාර්යභාරයන් ඉටු කරනු ලැබේ.

දැක්ම

ශ්‍රී ලංකා අපනයනයන් ඵලදායී ලෙස සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීම සඳහා පිළිගත් ලොව වඩාත්ම ප්‍රශංසාවට ලක් වන වෙළඳ ප්‍රවර්ධන ආයතනය බවට පත් වීම.

මෙහෙවර

ප්‍රතිපත්ති සකස් කිරීමේ ක්‍රියාවලිය, උපාය මාර්ගයන්ට යොමු කිරීම, වෙළඳපළ හා නිෂ්පාදන සංවර්ධනය තුළින් ප්‍රශස්ත (ඉතා යෝග්‍ය) අපනයන ආදායමක් කරා යාම සහ ජාතික ආර්ථිකයට දායකත්වයක් දැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ අපනයනයන් සහ අපනයනකරුවන් තුල ගෝලීය තරගකාරී බව ඇති කිරීම.

අරමුණු - 2020 අපේක්ෂිත ඉලක්ක

- 2020 දී අපනයන ආදායම ඇ.ඩො. බිලියන 20ක් ළඟා කර ගැනීම.
- තෝරා ගත් නිෂ්පාදන ක්ෂේත්‍රයන් සඳහා ගෝලීය තරගකාරී සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව විශ්වාසවන්ත සහ කීර්තිමත් රටක් බවට පත් කිරීම.
- අපනයනයේ ප්‍රතිලාභ විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත සහ රට පුරා සැපයුම් ජාලයට ගලා යාමට සැලැස්වීම.
- ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

අපනයන ප්‍රගතිය - 2016



2016 වසරේ දී ශ්‍රී ලංකාවේ භාණ්ඩ සහ සේවා අපනයනයන් මගින් උපයන ලද විදේශ විනිමය ඇ.ඩො.බිලියන 13.7 ක් වූ අපනයන ආදායම 2015 දී උපයන ලද ඇ.ඩො.බිලියන 13.8 හා සසඳන විට 0.27 ක සුළු අඩු වීමක් දක්නට ලැබේ.

2016 වසරේ දී භාණ්ඩ අපනයන ආදායම ඇ.ඩො.බිලියන 10.3 ක් වූ අතර 2015 වසරේදී එය ඇ.ඩො.බිලියන 10.5 ක් ලෙස වාර්තා වේ. කෙසේ වෙතත් තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ, ඉදිකිරීම්, මූල්‍ය සේවා සහ කාර්ය උපාය (Logistics) යනාදී අපනයන සේවා මගින් 2016 වසරේ දී ඇ.ඩො.බිලියන 3.5 ක විදේශ විනිමය උපයා දුන් අතර එය 6.1% ක සමස්ත වර්ධනයක් පෙන්නුම් කරයි. තවද කෘෂිකර්ම, කාර්මික සහ ධීවර යන අපනයන අංශයන් මගින් 2016 වසරේ සමස්ත භාණ්ඩ අපනයන ආදායමට 22.3%, 75.6% සහ 1.7% ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත.

පසුගිය වසර හා සසඳන විට 2016 වසරේ දී අපනයන ක්ෂේත්‍රයේ විශාලම දායකයා වූ ඇඟලුම් ක්ෂේත්‍රය 1.15% ක වර්ධනයක් පෙන්වන ලදී. එමෙන්ම 2016 වසරේ දී කැපූ පොල්, කොහු බත් සහ කෙඳි නිෂ්පාදන, සක්‍රීය කාබන්, රබර් ටයර් සහ ටියුබ්, කාර්මික සහ ශල්‍ය රබර් අත් වැසුම්, පාවහන්, ඇසුරුම් කළ තේ, මැණික්, ස්වර්ණාභරණ, තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර බාහිරකරණ යනාදී අපනයන අංශයන්ගේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන අතර තේ තොග, පොල් තෙල්, ශීත කළ මාළු, වියන ලද රෙදි, බෝට්ටු නිෂ්පාදන යනාදියෙහි සෘණ වර්ධනයක් වාර්තා කරන ලදී.

2016 වසරේ දී එක්සත් ජනපදයට කරන ලද අපනයන 1.3% කින් සහ ඇමරිකානු එක්සත් ජනපදයට 0.2% කින් 2015 වසර හා සසඳන විට වර්ධනය වී තිබේ. තවද ජර්මනිය, බෙල්ජියම, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඕස්ට්‍රේලියාව යනාදී රටවලට කරන ලද අපනයනයන්ගේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මීට අමතරව යුරෝපා සංගමයට සහ අප්‍රිකානු කලාපයට කරන ලද අපනයනයන්ගේ පිළිවෙලින් 3% සහ 2.9% ක වැඩි වීමක් පෙන්නුම් කර ඇත. කෙසේ වෙතත් 2016 වසරේ දී ඉන්දියාව, ජපානය, චීනය, රුසියානු සමූහ ආණ්ඩුව සහ කැනඩාව යන රටවලට කළ අපනයනයන්ගේ සැලකිය යුතු අඩු වීමක් දක්නට ලැබේ.

නිෂ්පාදන	2015 (ඇ.ඩො.මි)	2016 (ඇ.ඩො.මි)	% වර්ධනය
ඇඟලුම්	4,801.99	4,866.40	1.34
තේ	1,324.51	1,252.25	-5.46
රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදන	787.30	800.56	1.68
පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන	542.44	571.83	5.42
කුළු බඩු හා සගන්ධ තෙල්	373.11	311.54	-16.50
සකස්කළ ආහාර සහ පාන	225.09	330.61	46.88
විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපකරණ	247.76	271.35	9.52
දියමන්ති, මැණික් හා ස්වර්ණාභරණ	241.21	215.13	-10.81
මුහුදු ආහාර	163.06	169.61	4.02
රසායනික හා ප්ලාස්ටික් නිෂ්පාදන	116.08	118.78	2.33
පාවහන්	86.31	117.63	36.29
ලුහු ඉංජිනේරු නිෂ්පාදන	55.81	89.59	60.53
බෝට්ටු නිෂ්පාදන	181.61	64.76	-64.34
වෙනත්	1,400.22	1,129.66	-19.32
එකතුව	**10,546.50**	**10,309.70**	-2.25



අපනයන සංවර්ධන මණ්ඩලය එක්සත් රාජධානියේ පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාංශයේ වෙළඳ තරගකාරීත්වය පිළිබඳ අංශය සහ හාවඩ් කෙනඩි විද්‍යාලය සමඟ ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන සංයුතිය විවිධාංගීකරණය කිරීම පිළිබඳ පර්යේෂණ සිදු කරමින් සිටී. මෙමගින් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මුද්‍රිත පරිපථ සැකසුම් (Printed Circuit Board), පරිවරණය කළ වයර් (Insulated wires), බෝට්ටු සහ නැව් නිෂ්පාදන (Boat & Ship building), මෝටර් රථ උපාංග - රබර් ආශ්‍රිත (Automobile Components) යනාදී නිෂ්පාදන ප්‍රමුඛතාවය මත ප්‍රවර්ධනය කිරීම සඳහා හඳුනා ගන්නා ලදී.

2016 වසරේදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල විශේෂ අවස්ථා

1. ලෝක අපනයන සංවර්ධන සංසදය (WEDF) 2016

16 වන ලෝක අපනයන සංවර්ධන සමුළුව 2016 ඔක්තෝබර් 12 සහ 13 දිනයන්හි දී ශ්‍රී ලංකාවේ කොළඹ දී ප්‍රථම වරට පැවැත්වීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සත්කාරකත්වය සපයන ලදී. මෙමගින් සීඝ්‍රයෙන් සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාව, කාර්ය උපාය (Logistics) මධ්‍යස්ථානයක් ලෙස කලාපීය දියුණු ආර්ථිකයන් අතර සිදු කරන භූමිකාවේ වැදගත් බව සනිටුහන් කරන ලදී. ජිනීවා හි අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන මෙම සමුළුව දින 02 ක් පුරා "සාර්ථකත්වය සඳහා වෙළඳාම: සබඳතා, තරගකාරීත්වය, වෙනස් වීම" යන කාලෝචිත තේමාව යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යාංශයේ උපදේශකත්වයෙන් අපනයන සංවර්ධන මණ්ඩලය වසින් ශ්‍රී ලංකාවේ දී පැවැත්වීමට කටයුතු කරන ලදී. "

රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය Public, Private Partnership (PPP) මොඩලය යටතේ රාජ්‍ය ආයතන, වාණිජ මණ්ඩල හා පෞද්ගලික අංශය නියෝජනය කරමින් සැකසුණු මෙහෙයුම් කමිටුවක් මගින් මෙම සමුළුව පැවැත්වීම සංවිධානය කිරීම සුවිශේෂී කාර්යයකි.

මෙම දෙදින සමුළුව තුළින් ජාත්‍යන්තර වෙළඳාම සඳහා පහසුකම් සැපයූ අතර විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල වඩාත්ම දැවෙන සුළු වෙළඳ ගැටලු සහ අභියෝග පිළිබඳ විවෘත සංවාදයක් සඳහා පොදු වේදිකාවක් සකසා දෙනු ලැබීය. බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී වෙළඳ කටයුතු හා ආශ්‍රිත සංවර්ධන උපාය මාර්ග සහ විවෘත වෙළඳපළ පිළිබඳ සාකච්ඡා කිරීමට රටවල් 20ට අධික ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ප්‍රමුඛයින් 600 ක්, ප්‍රතිපත්ති සම්පාදකයින්, වෙළඳ නියෝජිතයන්, ආයෝජන ප්‍රවර්ධන ආයතන සහ ජාත්‍යන්තර වෙළඳ නිළධාරීහු සහභාගී වූහ.

ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ, සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය ගරු මලික් සමරවික්‍රම යන මැති ඇමතිවරුන්ගේ සහභාගීත්වයෙන් සමාරම්භක උත්සවය පවත්වන ලදී. මෙහිදී ITC හි විධායක අධ්‍යක්ෂිකා අරන්චා ගොන්සාලෙස්, පොදුරාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාංශයේ ගරු මහ ලේකම් පැට්‍රීෂියා ස්කොට්ලන්ට්, චීනයේ වාණිජ අමාත්‍යාංශයේ ගරු නියෝජ්‍ය අමාත්‍ය වැන්ග් ෂවුවන් මහතා, තායිලන්තයේ විශාලතම කාර්මික කලාප සංවර්ධක සහ අමාටා ප්‍රධාන විධායක නිලධාරි වික්‍රම් ක්‍රොමදිත් මහතා, යුරෝපය, මැදපෙරදිග සහ අප්‍රිකාව සඳහා වන ඊබේ සමාගමේ උප සභාපති ඊබන් සේමොන් මහතා යනාදී ජාත්‍යන්තර නියෝජිතයින් මෙම අවස්ථාවට සහභාගී විය.

හංගේරියානු ගරු විදේශ කටයුතු සහ වෙළඳ අමාත්‍ය පීටර් සයිජාටෝ, නියෝජ්‍ය රාජ්‍ය අමාත්‍ය ලේකම් ආචාර්ය පෙට්‍රා පනා, ආසියාවේ සහ පැසිපික් කලාපයන් සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසමේ විධායක ලේකම් ආචාර්ය ශම්ෂාඩ් අක්තාර් මැතිනිය, එක්සත් ජාතීන්ගේ වෙළඳ හා සංවර්ධන සම්මේලනයේ මහ ලේකම් ආචාර්ය මුකිෂා කිටුයි, සිංගප්පූරුවේ බුද්ධිමය කටයුතු පිළිබඳ ප්‍රධාන ආර්ථික විද්‍යාඥ ටෝනි නාෂ්, ඉන්දියානු කර්මාන්ත සම්මේලනයේ සභාපති ආචාර්ය නවුෂාඩ් ෆෝබ්ස්, DHL සමාගමේ මධ්‍යම නැගෙනහිර යුරෝපීය සහ මැද පෙරදිග රටවල ප්‍රධාන විධායක නිළධාරී ස්ටෙෆානෝ ආගනීස්, අලිබබා සමාගමේ උප සභාපති සහ අලී රිසර්ච් හි අධ්‍යක්ෂක හොංබිං ගව්, ආසියානු යටිතල පහසුකම් සහ ආයෝජන බැංකුවේ උප සභාපති සහ ප්‍රධාන ආයෝජන නිළධාරී ඩී.ජේ. පාන්ඩියන් සහ කෙන්යා ජාතික වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ ප්‍රධාන විධායක නිළධාරී චබුයලේ මටන්ඩා යනාදී ගෞරවාන්විත සම්භාවනීය අමුත්තන් සහ ව්‍යාපාරික නායකයින් රැසක් ද සහභාගී විය.

මෙම වාර්ෂිකව පවත්වනු ලබන මෙම සමුළුව සැසි කිහිපයකින් සමන්විත වන අතර එහිදී වෙනස්වන වෙළඳ ප්‍රතිපත්ති පිළිබඳ හා කර්මාන්තයන් පිළිබඳ වාද විවාද මෙන්ම තීරණ පිළිබඳ සාකච්ඡා කෙරේ. මෙවර සමුළුව සඳහා ප්‍රධාන සැසි වාර 4 ක් යටතේ පවත්වන ලදී. ‘‘සාගර හරහා කලාපීය කණ්ඩායම්‘‘ තේමාව යටතේ පැවති වැඩි දියුණු හා හොඳින් පාලනය වන වෙළඳ පහසුකම් සැපයීම තුළින් ගෝලීය සබඳතාවය පැවැත්වීමේ වැදගත්කම පිළිබඳ සාකච්ඡා සැසියක් ඩිජිටල් ආර්ථිකයේ තරගකාරීත්වය පිළිබඳ වෙළඳාම සඳහා ඩිජිටල් ද්වාර ගෝලීය වෙළඳපල සඳහා පිවිසීමට ප්‍රමිතීන් යන සැසිය මගින්

වෙනස්වන පාරිභෝගික අවශ්‍යතා සහ ප්‍රමිතීන් පිළිබඳව ද හා "අවශ්‍යජත්වය: නව සංචාරක ගමනාන්ත සැසිය මගින් සංචාරක කර්මාන්තයේ හැකියාවන් සහ ආයෝජන අවස්ථා මෙන්ම සංවර්ධනය පිළිබඳව සාකච්ඡා කරන ලදී.

මෙම සමුළුවේ පළමු වන දින ඉලක්ක ගත සැසි දෙකක් පවත්වනු ලැබූ අතර කලාපය තුළ ඉතා සාර්ථක ව්‍යවසායකයින් සහභාගී වූහ. "වෙළඳ පහසුකම් හා භාණ්ඩ ප්‍රවාහන හා ප්‍රාදේශිය ඒකාබද්ධතා" මැයෙන් පළමු සැසිය ද ව්‍යවසායකයින් නව්‍යකරණයට ඉඩ සලසන්නේ කෙසේද යන්න පිළිබඳව දෙවන සැසියෙන්ද අවධානය යොමු කරන ලදී.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (SMEs) සඳහා කාලෝචිත සහ ඵලදායී වෙළඳ මාතෘකාවන් පිළිබඳ "How to" වැඩමුළු සමුළුවේ දෙවන දිනයේ දී සංවිධානය කරන ලදී. මෙම සම්මන්ත්‍රණය ප්‍රධාන කේන්ද්‍රීය කණ්ඩායම් හරහා සිදු කරනු ලැබූ අතර ව්‍යවසායකයින්ගේ ව්‍යාපාරික අදහස්, කාන්තා ව්‍යවසායකයින් සඳහා නව ව්‍යාපාර පිළිබඳව ගවේෂණය, ව්‍යාපාර සඳහා ඩිජිටල් අලෙවිකරණයේ වැදගත්කම සහ කාර්යක්ෂම මෙන්ම සැලසුම්ගත ව්‍යාපාර ක්‍රියාවලි සහ සැපයුම් දාම කළමනාකරණය යනාදී ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳාම පිළිබඳ විශේෂඥයින් විසින් දේශන පවත්වන ලදී.

මෙම සමුළුව මගින් අපේක්ෂිත පරිදි දේශ සීමා හරහා ව්‍යාපාර අවස්ථා හා හවුල් ව්‍යාපාර බිහි කිරීම කඩිනම් කිරීමට හැකි විය. ලොව පුරා වෙළඳ නියෝජිතයින් 1000ට ආසන්න සංඛ්‍යාවක් WEDF සමුළුව හා සමගාමීව පැවති B2B සාකච්ඡාවන් මගින් අපනයන තරගකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය දැනුම හා අවබෝධය ද ලැබිණ. සංචාරක ව්‍යාපාරය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ඇගලුම් යනාදී ක්ෂේත්‍රයන් හි නිරත ශ්‍රී ලාංකීය සමාගම් 136ක් විදේශ ගැනුම්කරුවන් 116 දෙනෙකු සමග ව්‍යාපාරික:ව්‍යාපාරික (B2B) සාකච්ඡා පවත්වන ලදී. මෙම සමුළුව හා සමගාමීව ව්‍යාපාරික රැස්වීම් 1000ට අධික ප්‍රමාණයකට පහසුකම් සලසන ලදී.

දේශිය නිෂ්පාදන සහ සේවා, ඇගළුම් සිට රබර් නිෂ්පාදන දක්වා සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවා සිට මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදන දක්වා දේශිය වෙළඳ නාම 35ක් ඇතුලත් ප්‍රදර්ශනයක් ද සමුළුව හා සමගාමීව පැවැත්විණි. එහි දී Brandix Apparel, Mas Holdings, Akbar Brothers, Ceylon Tea Services, Camso Loadstar, Virtusa, 99X Technology, Gem Paradise සහ H D De Silva & Sons යනාදී සමාගම් තම හැකියාවන් ප්‍රදර්ශනය කරන ලදී.

2020 වසර වන විට ලොව පුරා කාන්තා ව්‍යවසායකයින් මිලියනයක් අන්තර්ජාතික වෙළඳපලට සම්බන්ධ කිරීමේ අරමුණින් WEDF 2016 සමුළුව මගින් අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානයේ වැඩසටහනක් වන She trades පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන ලදී. කොළඹ කොටස් වෙළඳපළේ පැවති She trades දියත් කිරීමේ වැඩසටහනේ දී අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානයේ විධායක නිළධාරී අරන්චා ගොන්සාලෙස් මැතිණිය විසින් අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපතිනිය සහ ප්‍රධාන විධායකතුමිය සහ කාන්තා වාණිජ කර්මාන්ත මණ්ඩලයේ සභාපතිතුමියගේ ආරාධනය පිළිගන්නා ලදී.

සමමේලනයට සමගාමීව ශ්‍රී ලංකාවේ සංස්කෘතිය සහ පෞඩ උරුමය ප්‍රදර්ශනය කිරීම සඳහා Sri Lankan Night සංවිධානය කිරිම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සත්කාරකත්වය සපයන ලදී. එමෙන්ම හැඳල දී දික්ඕවිට දී පවත්වන ලද බෝට්ටු ප්‍රදර්ශනය නැරඹීමේ අවස්ථාව සම්භාවනීය අමුත්තන්ට සලසා දෙන ලදී.

2016 ඔක්තෝබර් මස 13වන දිනෙන් අවසන් වූ මෙම ලෝක අපනයන සංවර්ධන සමුළුව ලංකාවේ ප්‍රථම වරට පැවැත්වීම මගින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් අතර ශක්තිමත් සබඳතාවයක් ගොඩනැගීමට හැකිවිය.

ජනාධිපති අපනයන සම්මාන උළෙල

20 වන ජනාධිපති අපනයන සම්මාන උළෙල, 2016 අගෝස්තු 9 වන දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කැබිනට් අමාත්‍යවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහභාගීත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලදී.

සම්මානලාභීන් තෝරා ගැනීම සිදු කරන ලද්දේ සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව, ලාංකික වාණිජ මණ්ඩලය, ජාතික අපනයන වාණිජ මණ්ඩලය සහ ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය යන ආයතනය නියෝජනය කළ ජේෂ්ඨ විනිසුරු නිලධාරියෙකු බැගින් සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමලත් විනිසුරුවරයෙකුගෙන් සමන්විත වූ විශිෂ්ට මණ්ඩලයක් විසින් ය.

විශාල සහ කුඩා හා මධ්‍යම අපනයන ව්‍යවසායකයන් සියල්ලට ම අවස්ථාවන් හිමිකර දීම සඳහා විවිධ නිර්ණායක පදනම් කර ගනිමින් තෝරා ගැනීම සිදු කරන ලදී. අපනයන ක්ෂේත්‍රයේ සංවර්ධනයට අත්‍යවශ්‍ය වන විවිධ අංශයන් යටතේ සිදු කරන ලද දායකත්වය පදනම් කර ගනිමින් විශේෂ සම්මානලාභීන් තෝරා ගත් අතර ශුද්ධ විදේශ විනිමය ඉපැයීම් වැඩි කිරීම, අපනයන වෙළඳපල විවිධාංගීකරණය, ශ්‍රී ලාංකික ලියාපදිංචිය ලත් අපනයන සන්නම් නාමයන්ගේ වටිනාකම රැකියා

උත්පාදනය, තිරසාර බවේ විශිෂ්ඨත්වය සහ අපනයන ආශ්‍රිත සැපයුම් දාමයට ප්‍රාදේශීය මට්ටමේ උපරිම දායකත්වය යනාදී යනාදී ක්ෂේත්‍ර රැසක් ආවරණය වන පරිදි එය සිදු කරන ලදී. එමෙන්ම අපනයන සංවර්ධන කර්තව්‍යයේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ දායකත්වය ඇගයීමට ලක් කරමින් ''හොඳම නැගී එන අපනයනකරු'' සම්මානයද පිරිනමන ලදී.

මෙම උළෙලේ දී 2014 සහ 2015 වසරවල අපනයන ක්ෂේත්‍රයේ විශිෂ්ටයන් ඇගයීම සඳහා විශේෂ සම්මාන 20ක් සහ භාණ්ඩ හා සේවා ක්ෂේත්‍ර සඳහා සම්මාන 23ක් ඇතුළු සම්මාන 113ක් අපනයනකරුවන්ට ලබා දෙන ලදී. එහිදී භාණ්ඩ ක්ෂේත්‍ර සම්මාන යටතේ උපරිම විදේශ විනිමය ඉපයීම සඳහා සම්මාන 29ක් සහ උපරිම අගය එකතු කිරීම සඳහා සම්මාන 64ක් ලෙස පිරිනමන ලදී.

රටේ අපනයන සංවර්ධනය සඳහා අපනයනකරුවන් ගනු ලබන ප්‍රයත්නයන් ජාතියේ ප්‍රණාමයට පාත්‍ර කිරීම මෙම සම්මාන පිරිනැමීමෙන් සිදු කෙරේ. මෙහිදී සම්මානලාභීන්ට කුසලානයක් සමඟ සහතික පත්‍රයක් ද ප්‍රදානය කෙරේ. ජයග්‍රාහකයින්ට මෙම කුසලානය වසර 3ක් පුරා අලෙවිකරණ උපකරණයක් ලෙස භාවිතා කළ හැක.

මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මැතිතුමා විසින් මෙහිදී ජාතික ආර්ථිකයට අපනයනකරුවන් සිදු කරන වැදගත් මෙහෙවර පිළිබඳ ප්‍රධාන දේශනය ඉදිරිපත් කරන ලදී.

සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය ගරු මලික් සමරවික්‍රම මැතිතුමා සහ අන්තර්ජාතික වෙළඳ රාජ්‍ය අමාත්‍ය ගරු සුජීව සේනසිංහ මැතිතුමා විසින් ජාත්‍යන්තර දූත මණ්ඩල, වාණිජ මණ්ඩල, නිෂ්පාදන සමාගම් ආදියෙන් පැමිණ සිටි 1200කට අධික සහභාගීවන්නන් අමතා දේශන පවත්වන ලදී.

විශේෂ සම්මානලාභීන්

සම්මාන	2014	2015
හොඳම නැගී එන අපනයනකරු	තරංගනී ඇඟලුම් පුද්ගලික සමාගම	සියෙරා ඉදිකිරීම් පුද්ගලික සමාගම
අපනයන සැපයුම් දාමයට ප්‍රාදේශිය මට්ටමෙන් උපරිම දායකත්වය	බ්‍රැන්ඩික්ස් ඇඟලුම් පුද්ගලික සමාගම	මාස් ඇක්ටිව් පුද්ගලික සමාගම
අපනයන කර්මාන්තයේ ඉහළම රැකියා සැපයුම්කරු	බ්‍රැන්ඩික්ස් ඇඟලුම් පුද්ගලික සමාගම	බ්‍රැන්ඩික්ස් ඇඟලුම් පුද්ගලික සමාගම
තිරසාර සංවර්ධනය පිළිබඳ විශිෂ්ටත්වය	බ්‍රැන්ඩික්ස් ඇඟලුම් පුද්ගලික සමාගම	ග්ලෝබල් රබර් ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම
අපනයන අංශය සඳහා හොඳම ඇසුරුම්කරණ සේවා සැපයුම්කරු	ස්ටාර් පැකේජින් පුද්ගලික සමාගම	කොරියන් ස්පා පැකේජින් පුද්ගලික සමාගම
අපනයන ක්ෂේත්‍රයේ නියැලී සිටින හොඳම බහුජාතික සමාගම (MNC)	නෙස්ලේ ලංකා පුද්ගලික සමාගම	නෙස්ලේ ලංකා පුද්ගලික සමාගම
ප්‍රධාන වෙළෙඳපොළ විවිධාංගීකරණ අපනයනකරු	මාස් ඇක්ටිව් ට්‍රේඩින් පුද්ගලික සමාගම	අක්බර් බ්‍රදර්ස් පුද්ගලික සමාගම

හොඳම ශ්‍රී ලාංකික අපනයන වෙළඳනාමය	අක්බර් බ්‍රදර්ස් පුද්ගලික සමාගම	අක්බර් බ්‍රදර්ස් පුද්ගලික සමාගම
ඉහළම ශුද්ධ විදේශ විනිමය උපයන්නා	බ්‍රැන්ඩික්ස් ඇඟලුම් පුද්ගලික සමාගම	බ්‍රැන්ඩික්ස් ඇඟලුම් පුද්ගලික සමාගම
ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම අපනයනකරු	බ්‍රැන්ඩික්ස් ඇඟලුම් පුද්ගලික සමාගම	බ්‍රැන්ඩික්ස් ඇඟලුම් පුද්ගලික සමාගම

සංවර්ධනය වැඩසටහන්

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2015 – 2020 උපාය මාර්ගික සැලැස්ම හා අනුව යමින් ව්‍යාපාර සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ සේවා අන්තර්ජාතික වෙළඳපළ අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි සංවර්ධනය කිරීමට මෙන්ම අපනයනකරුවන්ට නව වෙළඳපළ හඳුනා ගැනීමටත්, වෙළඳපළ විවිධාංගීකරණය විශේෂිත සේවා සැපයීමට සහ විශේෂයෙන් ප්‍රාදේශීය අපනයනය කිරීමට සුදුසු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ සැපයුම් දාමයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා පහසුකම් සැලසීමට සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී.

"ප්‍රධාන උපයන්නන්" වන නිෂ්පාදනයන්

1) ඇඟලුම් ක්ෂේත්‍රය

"SEDEX", "BSCI", "WRAD" යනාදී අන්තර්ජාතික සහතික ලබා ගැනීමේ දී සිදු කරන විගණනයන්ට අනුකූල වීම සඳහා අවශ්‍ය නිෂ්පාදන පහසුකම් වැඩිකර ගැනීමේ සුළු හා මධ්‍ය පරිමාණ ඇඟලුම් සමාගම් 4 ක් සඳහා රුපියල් මිලියන 1.2 ක සහනයක් ලබා දෙන ලදී. මෙහිදී අපනයන සංවර්ධන මණ්ඩලය විසින් එම සමාගම්වලට සහන සලසන යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම, විදුලි පද්ධති ස්ථාපනය, පරිපථ පුවරු, හදිසි ආලෝකකරණ පද්ධති, ආරක්ෂාව සඳහා ප්‍රමිතියෙන් යුතු තත්ත්වයන් ඇති කිරීම මෙන්ම අප ජලය පිරිපහදු කිරීම යනාදීන් සඳහාය. තවද ඒකාබද්ධ ඇඟලුම් සංසදයේ (JAAF) නිර්දේශය මත සුළු හා මධ්‍ය පරිමාණ සමාගම් 10ක් සඳහා සම්පත් බැංකුවෙන් හා DFCC බැංකුව මඟින් තාක්ෂණය ඉහළ නැංවීමේ කර්තව්‍යය සඳහා බැංකු ණය ලබා ගැනීමට යොමු කරන ලදී.

2016 නොවැම්බර් 15 සිට 18 දක්වා ඕස්ට්‍රේලියාවේ පැවැති "International Sourcing Expo" අන්තර්ජාතික ප්‍රදර්ශනය සඳහා ඕස්ට්‍රේලියාවේ සිඩ්නි සහ මෙල්බර්න් හි කොන්සල් ජනරාල් කාර්යාලය හා එක්ව ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ගේ සහභාගීත්වය සංවිධානය කරන ලදී. මේ සඳහා ශ්‍රී ලාංකීය අපනයනකරුවන් 8 දෙනෙක් සහභාගී වූ අතර ප්‍රදර්ශනයට අමතරව ඔවුන්ට ඕස්ට්‍රේලියානු විලාසිතා වෙළඳපල සංචාරයක නිරත වීමේ අවස්ථාවද හිමි විය. ඕස්ට්‍රේලියාවේ "International Sourcing Expo" ප්‍රදර්ශනය මඟින් ඇඟළුම්, උපාංග සහ රෙදිපිළි කර්මාන්තයන් එකම වේදිකාවක් මතට ගෙන ඒමේ අවස්ථාව ලබා දේ. මෙමගින් ඕස්ට්‍රේලියාවේ වෙළඳ ගැනුම්කරුවන්ට නව ව්‍යාපාරික සබඳතා ඇති කර ගැනීමේ අවස්ථාව සැලසේ. එමෙන්ම "Cotton On", "Forever New", "Bending Clothing", ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන ඇඟළුම් සමාගම් සමඟ "Metalicus", "Feathers" සහ Charles Persons යනාදී ප්‍රධාන වෙළඳ ජාලයන්, වෙළඳ ගැණුම් කණ්ඩායම්, තනි පුද්ගල මෙහෙය ඒජන්තවරු සහ බෙදාහරින්නන් නියෝජනය කරමින් සහභාගී වූ ප්‍රදර්ශකයින්ට ව්‍යාපාරික සබඳතා

ඇති කර ගැනීමේ අවස්ථාව හිමි වේ. මෙහි දී "Forever New" ඕස්ට්‍රේලියානු ප්‍රදර්ශනයට සහභාගී වූ අපනයනකරුවෙකුට ඇ.ඩො. 68,000 ක (රු. මිලියන 10.2 ක පමණ) වටිනාකමින් යුතු කාන්තා ඇඟළුම් ඇණවුමක් සැපයීමට අවස්ථාව උදා විය.

2) රබර් ආශ්‍රිත නිෂ්පාදන

පරිසර කළමනාකරණ සහ බලශක්ති කළමනාකරණ පද්ධති සඳහා වන ISO 14001 සහ 50001 සහතික ලබා ගැනීමට රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන සමාගම් 6 කට සහන ලබා දෙන ලදී.

3) තොරතුරු සන්නිවේදන තාක්ෂණ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ කොළඹ පිහිටි ජෙට්රෝ ආයතනයේ සහයෝගයෙන් 2016 මැයි මස 11 – 13 දිනයන්හි දී ජපානයේ පැවති "IT Week" අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලාංකික සහභාගීත්වය දෙවන වරටත් සංවිධානය කරන ලදී. මෙහිදී "Internet of Things", "Call Center Services", මෘදුකාංග සංවර්ධනය, ජංගම දුරකථන සඳහා මෘදුකාංග සහ ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සේවා යනාදී තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ සේවා අපනයනයේ නිරත වන ශ්‍රී ලාංකීය සමාගම් 9ක් මෙහිදි සහභාගී විය. සාර්ථක ව්‍යාපාරික රැස්වීම් කිහිපයකට අනුව ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදන ක්ෂේත්‍ර පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් ජපාන සමාගම් 30ක් සඳහා පවත්වන ලදී. ඇමරිකානු ඩොලර් මිලියන 2ට වැඩි ව්‍යාපාරික අවස්ථා ජපානයේ ප්‍රධාන තොරතුරු තාක්ෂණ සමාගම් මඟින් ෙමහිදී සහභාගී වූ ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ට ලැබිණ. එමෙන්ම හවුල් ව්‍යාපාරයන් 3ක්, ව්‍යාපාරික නියෝජිත අවස්ථා මෙන්ම වෙළඳ ගිවිසුම් සඳහා සාකච්ඡා පවත්වනු ලැබිණ. ජපානයේ නිගතා Prefecture හි GIT උද්‍යානයේ පවත්වා ගෙන යන ශ්‍රී ලාංකීය සමාගම් 5ක් සඳහා ප්‍රවාහන, ෙසෞඛ්‍ය හා කෘෂි කාර්මික ක්ෂේත්‍රයන් සඳහා IOT විසඳුම් ලබාදීම සඳහා ප්‍රදර්ශනයට සහභාගී වූ ශ්‍රී ලාංකීය සමාගමක් විසින් තම කාර්යාලයක් එහි ස්ථාපනය කරන ලදී. ජපාන තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංගමය හා පවත්වන ලද සාකච්ඡාවලට සමගාමීව ශ්‍රී ලාංකීය අපනයන සමාගම් 5කට ජපාන සමාගම් 11ක් හමුවීමේ අවස්ථාව උදාවිය. මෘදුකාංග සංවර්ධනය, බාහිරකරණ සේවා, "Internet of Things", සහ කෘතිම බුද්ධිය යනාදී සේවා සඳහා ඇ.ඩො 27,000 ක් වටිනා වෙළඳ ඇණවුම් ලැබිණ.

2016 ඔක්තෝබර් ඩුබායි හි පැවති GITEX Technology Week අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනය සඳහා අපනයන සමාගම් 5කින් සමන්විත ශ්‍රී ලාංකීය සහභාගීත්වය සංවිධානය කරන ලද අතර එමගින් යුරෝපා/අප්‍රිකානු කලාපයට ශ්‍රී ලාංකීය සමාගම් හඳුන්වා දීම මෙහි දී සිදු විය. මෙහි දී රු. මිලියන 117 ක් වටිනා වෙළඳ ඇණවුම් කටාර් රාජ්‍යය, ඒක්සත් අරාබි ඒමීරය, බහරේනය, සුඩානය යනාදී රටවලින් වලනය වන රූප, තොරතුරු තාක්ෂණ බාහිරකරණය යනාදී සේවා සඳහා ලැබිණ. එක් සමාගමක් ඇ.ඩො. 50,000 ක් වටිනා සාම්පල ඇණවුමක් ඩුබායි වෙත අපනයනය කරන ලදී. සුඩාන සමාගමක් ඔවුන්ගේ සෞදි අරාබියේ පිහිටි ශාඛා කාර්යාලය සමග සුඩානයේ සහ සෞදි අරාබියේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවා ප්‍රවර්ධනය සඳහා සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹීමට ශ්‍රී ලංකාවට පැමිණියහ. මැද පෙරදිග සහ උතුරු අප්‍රිකාවේ ක්‍රියාත්මක වන "Cloud" විසඳුම් ලබා දෙන සමාගමක් සමඟ/මූලික සාකච්ඡා පවත්වන ලද අතර නිෂ්පාදන ආදර්ශන පිළිබඳ ඩුබායි හි ඩිජිටල් සේවා සපයන්නෙකු මෙන්ම ඊජිප්තුවේ සහ ඩුබායි හි පිහිටි ඩිජිටල් නිර්මාණ ඒ්ජන්සිස් සහ මෘදුකාංග නිෂ්පාදන ආයතනයක් සමඟ ද වැඩි දුරටත් සාකච්ඡා පවත්වන ලදී.

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් "INFOTEL" ප්‍රදර්ශනයේ දී "IOT" සමාගම් 4ක් සහ "START-UPS" 6කින් සමන්විත "IOT" වෙළඳ මණ්ඩපය සංවිධානය කරන ලදී. මෙයින් සමාගම් 4ක්ම

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිදු කරනු ලැබූ ප්‍රවර්ධන වැඩසටහන්වලට සහභාගී වූ අතර එමගින් ජපානය, ඉන්දියාව සහ මැදපෙරදිග යනාදී වෙළඳපළට හඳුන්වා දෙනු ලැබූ ඒවා විය. අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානය සමඟ අපනයන අලෙවිකරණ සැලසුම් වැඩසටහන යටතේ සමාගම් 2ක් යුරෝපා වෙළඳපළට හඳුන්වා දෙන ලදී. 2016 ජුනි මස 10-12 දක්වා මහනුවර තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ව්‍යවසායකයන් 200 දෙනෙකුට තොරතුරු තාක්ෂණ අපනයන ක්ෂේත්‍රයේ ගෝලීය අවස්ථා සහ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයනකරුවන්ට ලබා දෙන සහන හා පහසුකම් පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. එමෙන්ම කාන්තා ව්‍යවසායකයින් සඳහා අන්තර්ජාතික අත්දැකීම් ලබා දීමට ඔවුන්ගේ හැකියාවන් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලදී. සැප්තැම්බර් 19-23 දක්වා ව්‍යාපෘති කණ්ඩායම් සහ කාන්තා ව්‍යවසායකයින් සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවයන් හඳුනා ගැනීමට පුහුණු සැසි කිහිපයක් පවත්වන ලදී. කාන්තා නායකත්වයෙන් යුතු සමාගම් 3ක් සඳහා ද අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අලෙවිකරණ සංවර්ධන වැඩසටහන් මඟින් සහන සලසන ලදී. "Orien city" සමාගමට ඇ.ඩො.මි. 25ක ආයෝජනයකින් සමන්විත වර්ග අඩි 700,000 ක් වපසරියකින් යුතු කාර්යාල සංකීර්ණයක් සඳහා පල්ලෙකැලේ ආයෝජන කලාපය තුළ අක්කර 7ක භූමියක් ලබා ගැනීමට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී.

ස්ථිර දායකත්වයක් සපයන අපනයන ක්ෂේත්‍රයන්

4) මැණික් හා ස්වර්ණාභරණ

ගෝලීය අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි ස්වර්ණාභරණ මෝස්තර නිෂ්පාදනය නිපුණතා සංවර්ධනය කිරීමේ අරමුණින් උසස් පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී. තායිලන්තයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහයෝගයෙන් තායිලන්ත මැණික් සහ ස්වර්ණාභරණ ආයතනය මගින් ශ්‍රී ලාංකීය ස්වර්ණාභරණ මෝස්තර නිෂ්පාදකයන් 10 දෙනෙක් සඳහා පුහුණු වැඩසටහනක් සංවිධානය කරන ලදී. ඔවුන්ට නවතම මෝස්තර නිර්මාණ මෙන්ම තාක්ෂණික ක්‍රම පිළිබඳ ව මෙහි දී අත්හදා බැලීමේ අවස්ථාව හිමි වූ අතර අපනයන වෙළඳපළට අනුකූල නිර්මාණ සැකසීම සඳහා තම නිර්මාණ කුසලතා ඔප් නංවා ගැනීමේ අවස්ථාව ද උදා විය.

මෙම කර්මාන්තයේ ව්‍යාප්ත වීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් සුළු හා මධ්‍ය පරිමාණ මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදකයින්ගේ හැකියාවන් ඔප් නැංවීමේ අරමුණින් මෙන්ම අන්තර්ජාතික වෙළඳපළට සහ සංචාරකයින්ට ගැළපෙන පරිදි නිෂ්පාදනයන් සිදු කිරීමට සහයෝගය සහ මාර්ගෝපදේශකත්වය සැපයීමට 2016 FACETS අන්තර්ජාතික මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනයේ දී අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 16කගෙන් සමන්විත විශේෂ වෙළඳ මණ්ඩපයක් සංවිධානය කරන ලදී. මෙහි දී ප්‍රදර්ශකයින්ට අපනයනකරුවන් සමඟ ඍජු සබඳතා ඇති කර ගැනීමේ අවස්ථාව හිමි වූ අතර දේශීය සහ විදේශීය ගැනුම්කරුවන්ට තම නිෂ්පාදන අලෙවි කිරීමෙන් රුපියල් මිලියන 5.2ක් හිමි කර ගැනීමට ව්‍යවසායකයින් 16 දෙනා සමත් විය.

වෙළඳපළ අවස්ථා ගවේෂණය කිරීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් රුසියාවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ 2016 මැයි මස 25-28 රුසියාවේ දී අපනයනකරුවන් 9ක් සහ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ නිලධාරීන්ගෙන් සමන්විත නියෝජිත පිරිසක් සඳහා වෙළඳපළ විවිධාංගීකරණය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා නියෝජිත පිරිස රුසියානු රේගුව, වාණිජ මණ්ඩල යනාදී ආයතන නිලධාරීන් හමුවීමේ අවස්ථාව ලැබුණු අතර මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ප්‍රවණතා, ක්‍රියාවලින්, රෙගුලාසි, බදු ව්‍යුහය සහ වෙළඳ ජාලයන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ද හැකි විය. එමෙන්ම 2016 FACETS ශ්‍රී ලංකා අන්තර්ජාතික ප්‍රදර්ශනය ප්‍රවර්ධනය කිරීමට අමතරව රුසියානු මැණික් සහ ස්වර්ණාභරණ ගැනුම්කරුවන් සමඟ ව්‍යාපාරික

සාකච්ඡා පවත්වන ලදී. FACETS 2016 ප්‍රදර්ශනය සඳහා රුසියානු ගැනුම්කරුවන් 10ක් පැමිණි අතර ඇ.ඩො. 100,000 ක් වටිනා, වෙළඳ අවස්ථා ශ්‍රී ලාංකීය ව්‍යවසායකයින්ට හිමි විය.

5) පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන

අපනයන සංවර්ධන මණ්ඩලය, ජපානයේ ජාතික කෘෂිකර්ම සමූපකාර සංගමයේ (JA) සහයෝගීත්වයෙන් ජපාන වෙළඳපළට "වගා මාළු" සහ "rice mat" යනාදී අගය එකතු කළ පොල් ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනය කිරීමේ වැඩ සටහනක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලාංකීය සමාගම් 6ක් ජපානයේ වගා නියමු ව්‍යාපෘතියක් සඳහා තම නිෂ්පාදන සපයන ලද අතර ජපාන JA සංගමය මගින් 2017 වසරේ දී ශ්‍රී ලාංකීය නිෂ්පාදන ලබා ගැනීමේ කැමැත්ත ප්‍රකාශ කරන ලදී. ජපානයේ ටෝකියෝ නුවර පැවති IFEX/GARDEX අන්තර්ජාතික ප්‍රදර්ශනය සඳහා කොහුබත් සහ කැපූ විසිතුරු මල් ආශ්‍රිත කොහු නිෂ්පාදනයන් හි නිරත වන ශ්‍රී ලාංකීය සමාගම් 7කින් සමන්විත ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපය සංවිධානය කරන ලදී. මෙහිදී ඇ.ඩො. 200,000/- වටිනා වෙළඳ ඇණවුම් ලැබුණු අතර ශ්‍රී ලාංකීය නිෂ්පාදකයන් සමඟ නව ව්‍යාපාර සබඳතා ඇති කර ගැනීමේ අරමුණින් ජපාන වෙළඳ ගැනුම්කරුවන් 2ක් ශ්‍රී ලංකාවේ සංචාරයක් සඳහා පැමිණියහ.

පිරිවැය බෙදා ගැනීමේ පදනම මත හම්බන්තොට TAWASHI බුරුසු නිෂ්පාදකයන්ගේ කණ්ඩායම් සංවර්ධනය කිරීමට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී. ඒ අනුව නවතම යන්ත්‍රෝපකරණවලින් සමන්විත නිෂ්පාදන මධ්‍යස්ථාන 6ක් සංවර්ධනය කරන ලදී. මෙමගින් රු. මිලියන 1.13 ක වටිනාකමකින් යුතු තවාෂි බුරුසු 679,260 ක් සෘජු අපනයනකරුවන් දෙදෙනෙකුට සැපයිය හැකි විය.

6) කුළු බඩු හා සගන්ධ තෙල්

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් චීනයේ බීජිං නුවර සගන්ධ තෙල් හා ඇරෝමා වෙළඳ සංගමයේ සහයෝගීත්වයෙන් ශ්‍රී ලාංකීය කුරුඳු වගාකරුවන්, අපනයනකරුවන්, සකස් කරන්නන් සහ ආශ්‍රිත රාජ්‍ය නිලධාරීන් 20කගෙන් සමන්විත කණ්ඩායමකට චීනයේ දී තාක්ෂණික වැඩසටහනක් 2016 ජුනි මස පවත්වන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2016 සැප්තැම්බර් 25-29 දක්වා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි නුවර පැවති සගන්ධ තෙල් සහ ඇරෝමා වෙළඳාම පිළිබඳ සම්මේලනයට ශ්‍රී ලාංකීය අපනයන සමාගම් 5ක් සහභාගී කරවන ලදී. මෙහිදී ඔවුන්ට සගන්ධ තෙල් සහ ඇරෝමා වෙළඳාමේ නවතම සංවර්ධනයන් පිළිබඳ අධ්‍යයනයට සහ ගැනුම්කරුවන් හමු වීමට ද අවස්ථා සැලසිය. එමෙන්ම මෙම සම්මේලනයට සහභාගී වූ අපනයන සමාගමකට, සුවඳ විලවුන් නිෂ්පාදනය කරන සමාගමකට අගය එකතු කළ කුළු බඩු නිෂ්පාදන සැපයීමේ අවස්ථාව උදා විය.

2015 වසරේ දී සංවර්ධනය කළ 'නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථාන 12ක් සඳහා GMP නිෂ්පාදන/පද්ධති සහතික ලබා ගැනීමට මණ්ඩලය විසින් සහන සලසන ලදී. රු. මිලියන 38.8 ක් වටිනාකමින් යුතු

සගන්ධ තෙල් මෙට්‍රික් ටොන් 6.9 ක් වක්‍ර අපනයනකරුවන් 10ක් විසින් සිදු කරන ලදී. රු. මිලියන 4.19ක් වටිනා කුරුඳු පොතු මෙට්‍රික් ටොන් 2.4 ක් එක් අපනයනකරුවෙකු සහ රු. මිලියන 5.6 ක් වටිනා කුරුඳු කොළ තවත් අපනයනකරුවෙකු විසින් අපනයනය කරන ලදී. තවද GMP සහතිකකරණය ලත් කුරුඳු සැකසුම් මධ්‍යස්ථාන 3ක් පිහිටුවීමට සහනයක් සලසන ලදී.

7) බෝට්ටු හා නැව් නිෂ්පාදන

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය සහ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ විවේක යාත්‍රා මෙහෙයුම් කර්මාන්තය සහ බෝට්ටු ආනයනය කිරීම සඳහා නියාමන රාමුවක් සැකසීමට වැඩසටහනක් ආරම්භ කරන ලදී. මේ සඳහා කොන්දේසි සහ නියමයන් (ToR) සකසන ලද අතර බෝට්ටු නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා නියාමන රාමුවක් සැකසීමට උපදේශක සේවා ලබා ගැනීමට දැන්වීමක් පල කරන ලදී.

අපනයන සංවර්ධන මණ්ඩලය, බෝට්ටු නිෂ්පාදන තාක්ෂණ සංවර්ධන ආයතනය හා එක්ව 16 වන ලෝක අපනයන සංවර්ධන සමුළුවට සමගාමීව 2016 ඔක්තෝබර් 13 සිට 16 දක්වා දික්ඕවිට ධීවර වරායේ දී ශ්‍රී ලංකා බෝට්ටු ප්‍රදර්ශනය පවත්වන ලදී. මෙම ප්‍රදර්ශනය වෙළඳ කුටි 50කින් සහ ජලය මත ප්‍රදර්ශනය කෙරෙන කුටි 12කින් සමන්විත විය. ප්‍රදර්ශනයට 10,000 ට අධික නරඹන්නන් රැසක් පැමිණි අතර මාලදිවයින, සීෂෙල්ස්, මොරිෂස්, ස්වීඩනය, සෝමාලියාව, කෙන්යාව, එක්සත් රාජධානිය, ඩුබායි, ඉන්දියාව, ඉතාලිය සහ නෙදර්ලන්තය යන ආදී රටවලින් 430 කට අධික පිරිසක් සහභාගී විය. ඉන්දියාව, ඩුබායි, ස්වීඩනය, කෙන්යාව, ප්‍රංශය, හොංකොං සහ සීෂේල්ස් යනාදි රටවලින් ගැනුම්කරුවන් 11ක් සහ IBT සඟරාවේ මාධ්‍යවේදීන්ගෙන් සමන්විත වෙළඳ දූත පිරිසක් මෙම ප්‍රදර්ශනය නැරඹීමට පැමිණියහ. ප්‍රදර්ශනයේ සමාරම්භක උත්සවයේ දී ලොව විශාලතම සුපිරි යාත්‍රා නිෂ්පාදනය කරන සමාගමක් වන “Benettl - ආසියා” හි සාමාන්‍යාධිකාරී නිසාර් ටකි මහතා විසින් සුපිරි යාත්‍රා කර්මාන්තය පිළිබඳ දේශනයක් සිදු කරන ලදී. ලෝක අපනයන සංවර්ධන සංසදයට පැමිණි විදේශ නියෝජිතයන් ඔක්තෝබර් 14 දින ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි අතර ශ්‍රී ලංකාවේ බෝට්ටු නිෂ්පාදන කර්මාන්තය සහ නාවික සංචරණය පිළිබඳ ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් ප්‍රදර්ශකයින් හා බෙදා ගන්නා ලදී. ඔවුන් වෙනුවෙන් මෝස්තර සැණකෙළියක් සහ සාකච්ඡා සැසි සංවිධානය කරන ලදී. මෙහි දී ඇ.ඩො.මි. 40ක් වටිනා ස්ථිර වෙළඳ ඇණවුම් නෙදර්ලන්තය, ඉන්දියාව සහ මාලදිවයින යනාදී රටවලින් ලැබිණි.

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ආයෝජකයන්ට ලබා දීම සඳහා ශ්‍රී ලංකාවේ බෝට්ටු නිෂ්පාදන කර්මාන්තය සහ නාවික සංචරණ කර්මාන්තයන් පිළිබඳ තොරතුරු සියලුම අංශයන් ආවරණය වන පරිදි වාර්තාවක් සැකසීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරිමට ආරම්භ කරන ලදී.

මේ අනුව කොන්දේසි සහ නියමයන් (ToR) සැකසීමට තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ගන්නා ලද අතර මෙම අධ්‍යයනය සිදු කිරීමට උපදේශක සමාගමක් තෝරා ගැනීම ද සිදු කෙරිණ. එමෙන්ම මෙම අධ්‍යයනය පිළිබඳ තෝරා ගත් උපදේශක සමාගම හා අදාල පාර්ශවකරුවන් අතර මූලික සාකච්ඡා පවත්වනු ලැබීය. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් බෝට්ටු නිෂ්පාදන ඉහළ නැංවීමේ ආයතනය (BTI) ට ICOMIA හි සාමාජිකත්වය ලබා ගැනීම සඳහා 2016 නොවැම්බර් මස සාකච්ඡා පවත්වනු ලැබීය.

අනාගත අපනයන ක්ෂේත්‍රයන්

8) විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන

2016 සැප්තැම්බර් මස දකුණු ඉන්දියාවේ දී මෙම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සඳහා වැඩසටහනක් සංවිධානය කරන ලදී. චෙන්නායි නගරයේ පැවැති ව්‍යාපාරික හමුවන් සඳහා ඉන්දීය විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික සමාගම් 73ක් සහභාගී වූ අතර බැංගලෝර් හි පැවති "Electronica & Productionica" ප්‍රදර්ශනයට සහභාගී වූ ශ්‍රී ලාංකීය සමාගම්වලට වෙළඳපළ ගවේෂණය, තාක්ෂණයේ සහ නවෝත්පාදන පිළිබඳ නව ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයට මෙන්ම වෙළඳ සබඳතා ද ඇති කරගැනීමේ අවස්ථාව හිමි විය. මෙම වැඩසටහන තුළින් ප්‍රධාන ඉන්දියානු සමාගම් හමුවීමට සහ කර්නාටක ඉලෙක්ට්‍රොනික් කර්මාන්ත සම්මේලනයේ සභාපති සහ විධායක සාමාජිකයන් හමුවීමේ අවස්ථාව සහභාගී වූ ශ්‍රී ලාංකීය සමාගම්වලට හිමි විය. චෙන්නයි නගරයේ "Renault Nissan" සහ බැංගලෝර් හි "Toyota" නිෂ්පාදන සමාගම්වල සංචාරයේ නිරත වීමට ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ට අවස්ථාව හිමි වූ අතර එහිදී ඔවුන්ට ආරක්ෂක ප්‍රමිතීන් පරිසර හිතකාමී නිෂ්පාදන විධි සහ වාහන නිෂ්පාදන කර්මාන්තය සඳහා දෙවන පෙළ සැපයුම්කරුවකු ලෙස එක් වීම පිළිබඳ අධ්‍යයනය කිරීමේ අවස්ථාව හිමි විය. බැංගලෝර් හි පිහිටි මධ්‍යම ශක්ති පර්යේෂණ ආයතනය (CPRI) විසින් ශ්‍රී ලංකාවේ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන සමාගම් සඳහා නිෂ්පාදනවලට අන්තර්ජාතික ප්‍රමිති සහතික ලබා ගැනීමේ පහසුකම් ලබා දීමට මෙන්ම ක්‍රමාංකනය කිරීම් යනාදිය සිදු කර දීමට කැමැත්ත පළ කරන ලදී. එමගින් ශ්‍රී ලාංකීය සමාගම්වලට මෙතෙක් ජපානය සහ යුරෝපා රටවලින් සිදු කර ගනු ලැබූ පර්යේෂණ ඉන්දියාවේ දී සැලකිය යුතු ලෙස අඩු පිරිවැයකින් කර ගැනීමේ හැකියාව උදා විය.

9) මුහුදු ආහාර සහ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2016 වසරේ පැවැති 14 වැනි ලෝක වෙළඳ කෙලවල්ලා මත්ස්‍ය සම්මේලනය සඳහා ශ්‍රී ලාංකීය අපනයන සමාගම් 2ක් සහභාගී කරවන ලදී. මෙහිදී ලබාගත් දැනුම අපනයනකරුවන් සහ අපනයනය කිරීමට සූදානම් ව්‍යවසායකයන් අතර බෙදා ගැනීම සිදු කරන ලදී. 2016 මැයි මස 24-29 දිනයන්හි ජර්මනියේ නියුරම්බර්ග් හි පැවති "Interzoo" අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනයේ දී අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලාංකීය සමාගම් 5ක සහභාගීත්වයෙන් යුතු ශ්‍රී ලාංකීය වෙළඳ මණ්ඩපය සංවිධානය කරන ලදී. මෙහි දී ශ්‍රී ලාංකික සමාගම්වලට ඇමරිකානු ඩොලර් 11,000 ක ස්ථිර වෙළඳ ඇණවුම් හිමි විය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ විිසිතුරු මත්ස්‍ය වගාකරුවන්ගේ නිරෝධායන රඳවා ගැනීමේ පහසුකම් සංවර්ධනයට සහ හැකියාවන් ඔප් නැංවීම සඳහා යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලද අතර නිරෝධායන පහසුකම් ස්ථාපනය කිරීමට සහන ලබා දීමට නිෂ්පාදකයින් 17ක් තෝරා ගන්නා ලදී. එමෙන්ම අපනයන සමාගමක් මණ්ඩලය විසින් වගාකරුවන් හා සම්බන්ධ කරන ලදී.

10) පළතුරු සහ එළවළු

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානය හා එක්ව යුරෝපා වෙළඳපළට සුදුසු පරිදි එළවළු හා පළතුරු නිෂ්පාදනවල තත්ත්වය ඉහළ නැංවීම සඳහා වගා බිම්වල යහපත් කෘෂිකර්ම විධි (GAP) අනුගමනය කිරීම විධිමත් කිරීම සඳහා වැඩසටහනක් ආරම්භ කරන ලදී. මේ යටතේ විදේශීය උපදේශකයෙකු විසින් ගොවීන් 500ක් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවීන් පුහුණු කරන්නෙකුට ද විශේෂ පුහුණු වීමේ අවස්ථාවක් ලබා දෙන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පළතුරු සහ එළවළු නිෂ්පාදන සමාගම් 10ක් මෙම වැඩසටහනට යොමු කරන ලදී. මෙම වැඩසටහනේ ප්‍රතිඵලයක් ලෙස 2014 වසරේ යුරෝපා සංගමයේ අනුකූල නොවූ අවස්ථා දැනුම් දීම් 275, 2016 අවසන් වන විට අවස්ථා 16ක් දක්වා පහත වැටී තිබිණ.

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ අන්නාසි වගාකරුවන් 80ක් සහ වැල් දොඩම් වගාකරුවන් 24ක් සෘජු අපනයන සමාගම් හා සම්බන්ධ කරන ලදී. 2015 වසරේ දී ආරම්භ කරන ලද කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගර්කින් වගාව සඳහා වගා කණ්ඩායම් සංවර්ධනය, තාක්ෂණය ඉහළ නැංවීම සහ සෘජු අපනයනකරුවන් හා සම්බන්ධ කරවීම යනාදීන් 2016 වසරේ දී මණ්ඩලය විසින් සිදු කරන ලදී. ගොවීන් 17කින් යුත් වගා කණ්ඩායමක් අපනයන සමාගමක් හා නිෂ්පාදන මිළදී ගැනීමේ ගිවිසුමකට එළඹිණ.

11) විසිතුරු මල් හා පැල

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ නෙදර්ලන්ත තානාපති කාර්යාලය හා එක්ව ශ්‍රී ලාංකීය සමාගම් 16ක් සඳහා නෙදර්ලන්තයේ තාක්ෂණික ගවේෂණ වැඩසටහනක් සංවිධානය කරන ලදී. එහි දී නෙදර්ලන්ත ආයෝජකයින් සඳහා ශ්‍රී ලංකාවේ පවත්නා ආයෝජන අවස්ථා හඳුන්වා දීමට ප්‍රචාරක වැඩසටහනක් ද සිදු කරන ලදී. ශ්‍රී ලාංකීය සමාගම්වලට ඔවුන් වගා විධි සංවර්ධනය කර ගැනීමට නව තාක්ෂණයන් හඳුනා ගැනීමට මෙන්ම නව ශාඛා ප්‍රභේද හඳුනා ගැනීමේ අවස්ථාව ද හිමිවිය. මෙයට අමතරව 2016 අප්‍රේල් මස හොංකොංහි පැවති අන්තර්ජාතික උද්‍යාන විද්‍යාව පිළිබඳ ප්‍රදර්ශනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලාංකීය සමාගම් 4ක් සහභාගී කර වූ අතර එමගින් ඇමරිකානු ඩොලර් 8000ක ස්ථිර වෙළඳ ඇණවුම් මාසයක් පතා ලබා ගැනීමට හැකිවිය.

අනෙකුත් අපනයන ක්ෂේත්‍රයන්

12) ආහාර සහ පාන ක්ෂේත්‍රය

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2016 පෙබරවාරි 21-25 දක්වා ඩුබායි නගරයේ පැවැති GulfFood අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලාංකීය අපනයනකරුවන් 24 දෙනෙක් සහ එක් නිරීක්ෂකයෙකුගෙන් සමන්විත ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපය සංවිධානය කරන ලදී. මෙහි දී ඇ.ඩො.මිලියන 10ක වටිනාකමකින් යුතු වෙළඳ ඇණවුම් ලැබිණ. ආකර්ෂණීය ජපාන වෙළඳපළ ජය ගැනීමේ අරමුණින් ජපානයේ පැවැති FOODEX අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලාංකීය අපනයන සමාගම් 4ක් සහභාගී කරවන ලදී. එහිදී ඇ.ඩො. 120,000ක් වටිනා වෙළඳ ඇණවුම් ලබා ගැනීමට ශ්‍රී ලාංකීය සමාගම් සමත් විය. වසර දෙකකට වරක් ප්‍රංශයේ පැවැත්වෙන SIAL අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනයට ශ්‍රී ලාංකීය අපනයනකරුවන් 13කින් සමන්විත ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපය සංවිධානය කරන ලදී. මෙහි දී ඇ.ඩො. මිලියන 10ක වටිනාකමකින් යුතු වෙළඳ ඇණවුම් ලැබිණ. ආකර්ෂණීය ජපාන වෙළඳපළ ජය ගැනීමේ අරමුණින් ජපානයේ පැවති FOODEX අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලාංකීය අපනයන සමාගම් 4ක් සහභාගී කරවන ලදී. එහිදී ඇ.ඩො 120,000 ක් වටිනා වෙළඳ ඇණවුම් ලබා ගැනීමට ශ්‍රී ලාංකීය සමාගම් සමත් විය. වසර දෙකකට වරක් ප්‍රංශයේ පැවැත්වෙන SIAL අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනයට ශ්‍රී ලාංකීය අපනයනකරුවන් 13කින් සමන්විත ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපය සංවිධානය කරන ලදී. මෙහිදී ඇ.ඩො.මි 1.5 ක් වටිනා ස්ථිර වෙළඳ ඇණවුම් හිමි විය. එමෙන්ම එක් සමාගමකට පොල් වතුර ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය විමේ හැකියාව ලැබිණ. ඉතාලිය, ප්‍රංශය සහ ජර්මනිය යනාදී රටවලින් රතු සහල් සඳහා නියෝජිතවරුන් හමුවිය.

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් එක්සත් රාජධානියේ පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ සහයෝගීත්වයෙන් ඉන්දියාවට සැකසූ ආහාර අපනයනයේ දී සනීපාරක්ෂක මිනුම් සහ වෙළඳාම සඳහා තාක්ෂණික බාධක මග හරවා ගැනීම පිළිබඳ වැඩ මුළුවක් පවත්වන ලදී.

ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනයන් ඉන්දියානු ප්‍රමිතීන්ට අනුකූල පරීක්ෂාවන් සිදු කිරීමට සුදුසු ශ්‍රී ලාංකීය රසායනාගාර පිළිබඳ යෝජනාවක් ඉන්දියානු සුරක්ෂා සහ ප්‍රමිති අධිකාරියට යොමු කරන ලදී.

13) පිඟන් සහ පෝසිලේන් නිෂ්පාදන

අපනයන තත්ත්වයට සුදුසු රතු උළු කර්මාන්තයේ නිෂ්පාදකයින් 5-7 දෙනෙක් සඳහා ඔවුන්ගේ නිෂ්පාදිතවල තත්ත්වය, ඵලදායිතාව ඉහළ නැංවීම සහ අන්තර්ජාතික වෙළඳපළ තරගකාරීත්වය වැඩි දියුණු කිරීමට තාක්ෂණ සංවර්ධන වැඩසටහන් ආරම්භ කරන ලදී. එමගින් අපනයන සංවර්ධන මණ්ඩලය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා අවශ්‍ය පිරිවැය 25%ක් රුපියල් මිලියන 1.5ක උපරිමයකට යටත්ව ප්‍රතිපූරණය කරනු ලැබේ. මේ සඳහා අයදුම්පත් 7ක් ලැබී තිබුණද අත්‍යවශ්‍ය ලියකියවිලි ලබා දීමේ අඩු ලුහුඩුකම් මත මෙම වැඩසටහන 2017 වසර සඳහා ඉදිරියට ගෙන යන ලදී.

14) පාවහන් සහ සම් භාණ්ඩ නිෂ්පාදන

8 වන පාවහන් සහ සම් භාණ්ඩ ප්‍රදර්ශනය 2016 පෙබරවාරි 5-7 දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වනු ලැබීය. එය දේශිය වෙළඳ කුටි 107 ක් සහ විදේශීය වෙළඳ කුටි 15ක් ඇතුළු වෙළඳ කුටි 131කින් සමන්විත විය. 16 දෙනෙකුගෙන් සමන්විත ඕමාන වෙළඳ ගැනුම්කරුවන් පිරිසක් ප්‍රදර්ශනයට පැමිණියහ. එයට අමතරව කෙන්යාව (3), ඉන්දියාව (2ක්), ස්වීඩනය (2ක්), දකුණු අප්‍රිකාව (3ක්) සහ එක්සත් අරාබි එමීරය (2ක්) ලෙසද ගැනුම්කරුවන් රැසක් පැමිණ සිටියහ. ප්‍රදර්ශනයට සමගාමීව විලාසිතා දැක්ම, නිර්මාණ තරඟය හොඳම වෙළඳ කුටිය තේරිම සහ වඩාත් ම නවෝත්පාදන නිපැයුම් කෙරෙහි යොමු වූ සුළු පරිමාණ ව්‍යවසායකයා තේරීම යනාදී තරඟ පැවැත්විණ. ප්‍රදර්ශනය මගින් ප්‍රදර්ශකයන් විසින් රුපියල් මිලියන 4.66 ක ආදායමක් උපයා ගෙන තිබිණ. මෙහි දී රුපියල් මිලියන 6.48 ක් වටිනා ස්ථිර වෙළඳ ඇණවුම් සාම්පල විකිණීමෙන් රුපියල් මිලියන 3.72ක්, නිෂ්පාදන ප්‍රදර්ශන භූමියේ අලෙවියෙන් රු. මිලියන 9.93ක් මෙන්ම රු. මිලියන 1.6ක වටිනාකමකින් යුතු විදේශ ගැනුම් ඉල්ලීම් සහ ඇණවුම් ලැබී තිබිණ.

15) ලුහු ඉංජිනේරු නිෂ්පාදන

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ලුහු ඉංජිනේරු නිෂ්පාදන ක්ෂේත්‍රයේ යෙදෙන ශ්‍රී ලංකා ව්‍යවසායකයන් 11ක් සඳහා ඉන්දියාවේ දී වාත්තු කර්මාන්ත ක්ෂේත්‍රය නිෂ්පාදන විධි පිළිබඳ ගවේෂණය කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙහි දී ඔවුන්ට සෙරමික් ආලේපන භාවිතා කිරීමේ තාක්ෂණයන් පිළිබඳ දැනුවත් වීමට අවස්ථාව හිමි විය. එමෙන්ම ඔවුන්ට IFEX ප්‍රදර්ශනය නැරඹීමට හා තාක්ෂණික සැසියන් සහභාගී වීමට හැකි වූ අතරම සෙරමික් ආලේපන කර්මාන්ත ශාලාවක් ඇතුළු කර්මාන්ත ශාලා 6ක්ද නැරඹීමට හැකි විය. එක් ශ්‍රී ලාංකීය සමාගමක් ඉන්දියාවේ “El Tech Ceramics” සමාගම සමඟ සෙරමික් ආවරණ තාක්ෂණය ලබා ගැනීම පිළිබඳ සාකච්ඡා පවත්වනු ලැබීය. එමෙන්ම ඔවුන් El Tech Ceramics සමාගම නැවත වරක් නැරඹීමට අපේක්ෂිතය.

ඊට අමතරව ශ්‍රී ලාංකීය නියෝජිතයින් ඉන්දීය වාත්තු කර්මාන්ත සංගමයේ සභාපති හමු වී ශ්‍රී ලංකා වාත්තු කර්මාන්තය සංවර්ධනය සඳහා ඔවුන්ගේ විශේෂඥ සේවාවන් ලබා දෙන මෙන් ඉල්ලා සිටියහ. ඒ අනුව ඉන්ෆොටෙක් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී මහතා ශ්‍රී ලංකාවට පැමිණි අතර නව තාක්ෂණය හා යන්ත්‍රෝපකරණ පිළිබඳ හඳුන්වා තාක්ෂණික සැසියක් සිදු කරන ලදී.

තේ නිෂ්පාදන යන්ත්‍රෝපකරණ සහ අගය එකතු කළ ඇලුමිනියම් නිෂ්පාදන සඳහා ඇ.ඩො. 125,000 ක් වටිනා වෙළඳ ඇණවුම් ලැබිණ.

16) ප්ලාස්ටික් නිෂ්පාදන

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2016 ජුනි 12-13 දක්වා ඉන්දියාවේ චෙන්නයි නගරයේ දී ශ්‍රී ලාංකීය ප්ලාස්ටික් නිෂ්පාදන සමාගම් 07ක නියෝජිතයින් සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහනක් සංවිධානය කරන ලදී. මේ තුලින් ශ්‍රී ලාංකීය සමාගම්වලට උසස් තාක්ෂණය පිළිබඳ දැනුම, යන්ත්‍රෝපකරණ, තත්ත්ව පාලන විධි සහ මෙහෙයුම් ක්‍ර පිළිබඳව මෙන්ම ගැටලු සඳහා ප්‍රායෝගික විසඳුම් ලබා ගැනීම පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීමට හැකි විය.

17) සෞඛ්‍ය සේවා

ශ්‍රී ලංකා ආයුර්වේද ක්ෂේත්‍රයේ හැකියාවන් ප්‍රවර්ධනය හා ප්‍රදර්ශනය කිරීමට ශ්‍රව්‍ය දෘශ්‍ය (AV) නිර්මාණයක් සිදු කරන ලදී. මෙය ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ජර්මනියේ බර්ලින් නුවර 17B ප්‍රදර්ශනයේ දී සංවිධානය කළ ශ්‍රී ලංකා මණ්ඩපයේ දී ප්‍රවර්ධන කටයුතු සඳහා යොදා ගනු ලැබීය. එමෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙය සමාජ ජාලයන්හි ද ප්‍රවර්ධනය කරනු ලැබේ.

18) තෑගි භාණ්ඩ නිෂ්පාදන

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් විදේශීය මෝස්තර විශේෂඥයකුගේ උපදේශකත්වයෙන් හම්බන්තොට, මඩකලපුව සහ යාපනය යන ප්‍රදේශයන් හි මෝස්තර සංවර්ධන වැඩමුළු 3ක් පවත්වන ලදී .මෙහිදී 200කට අධික නව මෝස්තර සංවර්ධනය කරනු ලැබූ අතර එක් එක් සමාගමට වෙන වෙනම උපදේශන සේවා ලබා දීම සිදු කරන ලදී. 2016 – 2018 සාධාරණ වෙළඳාම පිළිබඳ සහතිකය ලබා මූල්‍ය සහන ලබා දීමේ යෝජනා ක්‍රමය යටතේ සමාගම් 2කට සහනයක් සැලසීය.

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඇමරිකා එක්සත් ජනපදය පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා එක්ව 2016 අගෝස්තු 21-26 දක්වා ඇමරිකාවේ NY Now ප්‍රදර්ශනයේ “Artisan Resource” පර්යන්තයේ දී ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපය සංවිධානය කළ අතර එහිදී විදේශ විශේෂඥ උපදේශකත්වයෙන් සංවර්ධනය කළ මෝස්තර ප්‍රදර්ශනය කරනු ලැබීය. නිව්යෝර්ක් නගරයේ පැවැති මෙම ප්‍රදර්ශනයට ශ්‍රී ලංකාව සහභාගී වූ පලමු අවස්ථාව මෙය වූ අතර මෙහි දී සහභාගී වූ ශ්‍රී ලාංකීය නිෂ්පාදකයින්ට වෙළඳපළ හා නිෂ්පාදන ප්‍රවණතා, මිල කරණය, අලෙවිය පිළිබඳ මෙන්ම විශේෂයෙන් ඉලක්ක ගත වෙළඳපළ තරගකාරීත්වය පිළිබඳ දැනුම ලබා ගත හැකි විය. එමෙන්ම මෙය නව නිපැයුම්, නිෂ්පාදන හැකියාව, විශේෂිත ප්‍රතිචක්‍රීකරණය කළ නිෂ්පාදන, විවිධ අලෙවිකරණ සහ නිෂ්පාදන සංකල්ප පිළිබඳ ගවේෂණාත්මක තොරතුරු සොයා ගැනීමට ඉතා සුදුසු ප්‍රදර්ශනයකි. ප්‍රදර්ශනයේ සමාරම්භක උත්සවයට තානාපති කාර්යාලයේ නිලධාරීන්, එක්සත් ජාතීන්ගේ සංගමය, සමාගම් සහ ප්‍රදර්ශනයේ සංවිධායකවරු සහභාගී විය.

ශ්‍රී ලාංකීය අපනයනකරුවන් ද ඇ.ඩො. 33,000 ක් වටිනාකමකින් යුතු ස්ථිර වෙළඳ ඇණවුම් හිමි වූ අතර ඇ.ඩො. 270,000 ක වෙළඳ ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී. එමෙන්ම ඔවුන් බෙදා හරින්නන් 8ක්, ආනයනකරුවන් 21, ඒජන්තවරුන් 2ක්, තොග වෙළෙන්දන් 15ක් සහ සිල්ලර වෙළඳුන් 50ක් සමඟ ව්‍යාපාරික සබඳතා ඇති කර ගැනීමට සමත් විය.

වෙළඳපළ ප්‍රවර්ධන වැඩසටහන්

1) නව වෙළඳපළ ගවේෂණය

චීනය නව වෙළඳපළක් ලෙස ගවේෂණය කිරීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් වෙළඳ ප්‍රදර්ශන 3ක් සඳහා ශ්‍රී ලංකා සහභාගීත්වය සංවිධානය කරන ලදී.

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2016 ජුනි මස චීනයේ යුනාන් ප්‍රාන්තයේ පැවති 4 වන දකුණු ආසියා ප්‍රදර්ශනයට සමාගම් 127 සහ රාජ්‍ය ආයතන 6ක සහභාගීත්වයෙන් වෙළඳ කුටි 130ක් සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපය තුළ තේ, මැණික් හා ස්වර්ණාභරණ, අත්කම් නිෂ්පාදන, ශාකසාර නිෂ්පාදන, කොහු නිෂ්පාදන හා සංචරණ යනාදී ක්ෂේත්‍ර රාශියක් ප්‍රදර්ශනය කරන ලදී. එහිදී රු. මිලියන 54ක් වටිනා ස්ථිර වෙළඳ ඇණවුම් රු. මිලියන 127.5 ක සාකච්ඡා මට්ටමේ පවත්නා වෙළඳ ඇණවුම් මෙන්ම රු. මිලියන 615 ක නිෂ්පාදන අලෙවි ප්‍රදර්ශන පරිශ්‍රයේ දී සිදු විය. ව්‍යාපාරික ඉල්ලීම් 4,675 ක් සහ අවබෝධතා ගිවිසුම් 2-3ක් පිළිබඳ සාකච්ඡා සිදු කරන ලදී.

එමෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලය 2016 මැයි මස චීනයේ ජියන්සු ප්‍රාන්තයේ චීන ආනයන අපනයන ප්‍රදර්ශනයේ ATPF කලාපය තුළ මැණික් හා ස්වර්ණාභරණ, තේ, අත්කම් භාණ්ඩ හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයේ යෙදෙන ශ්‍රී ලාංකීය සමාගම් 17 කගේ සහභාගීත්වය සංවිධානය කරන ලදී. මෙහි දී “Adam”, “Spice of Life”, “Super Sun”, යනාදී ශ්‍රී ලාංකික වෙළඳ සන්නම් ප්‍රවර්ධනය ද සිදු කෙරිණ. ව්‍යාපාරික ඇණවුම් 30-40 ක් ලබා ගැනීමට සහභාගී වූ ශ්‍රී ලාංකීය සමාගම් සමත් වූ අතර ප්‍රදර්ශන පරිශ්‍රයේ දී රු. මිලියන 7ක වටිනාකමකින් යුතු නිෂ්පාදන අලෙවි වී තිබිණ. අනුබද්ධිත සමාගම් 5ක් සඳහා සාකච්ඡා සඳහා සහ තවත් සමාගම් 3-5ක් සඳහා නියෝජිතයින් පත්කිරීම පිළිබඳ ද සාකච්ඡා කරන ලදී. මෙයට අමතරව අපනයන සංවර්ධන මණ්ඩලය 2016 ඔක්තෝබර් මස ගොවන්ෂු ප්‍රාන්තයේ 13වන චීන අන්තර්ජාතික සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව ප්‍රදර්ශනය සඳහා සමාගම් 34කින් සමන්තවිත ශ්‍රී ලාංකීය සහභාගීත්වය සංවිධානය කරන ලදී. ඉන් 29ක්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වූ අතර 3ක් හඳුන්වා දුන් නව අපනයනකරුවන්ය.

රු. මිලියන 5.7 ක වටිනා නිෂ්පාදන අලෙවිය ප්‍රදර්ශන පරිශ්‍රයේ දී සිදු විය. මැණික් හා ස්වර්ණාභරණ, බිත්ති රඳවන සහ මෘදු සෙල්ලම් බඩු යනාදී නිෂ්පාදන සඳහා ඇ.ඩො. 5420 ක් වටිනා ස්ථිර වෙළඳ ඇණවුම් හිමි වූ අතර වෙල්වට් චිත්‍ර, රිදී මුදු, රිදී මාල පෙති, තේ, කළු තේ, යනාදිය සඳහා ද ඇණවුම් ලැබී තිබිණ. එමෙන්ම බතික් නිෂ්පාදන, ශාකසාර තේ, වෙල්වට් චිත්‍ර යනාදිය සඳහා ඇණවුම් සාකච්ඡා මට්ටමේ පවතී.

රුසියාව

රුසියානු වෙළඳපළට ශ්‍රී ලාංකීය ආහාර හා පාන වර්ග හඳුන්වා දීමේ අරමුණ ඇතිව 2016 පෙබරවාරි 8-12 රුසියාවේ මොස්කව් නුවර පැවති PRODEXPO ජාත්‍යන්තර ආහාර සහ පාන ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලාංකීය අපනයනකරුවන් 8කගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපය සංවිධානය කරන ලදී. පොල් නිෂ්පාදන සඳහා “Eco Nutrena” ද “Haritha” “Olinda” සහ “Eminet” යන තේ සන්නම්නාමයන්ද මෙහි දී ප්‍රවර්ධනය කරන ලදී. රු. මිලියන 285ක අපනයන ඇණවුම් ලැබුණු අතර වෙළඳ සාකච්ඡා 207ක් පවත්වන ලදී.

කැනඩාව

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2016 වසරේ කැනඩාවේ පැවති SIAL CANADA ප්‍රදර්ශනයේ මොන්ට්‍රියල් පරිශ්‍රයේදී අපනයනකරුවන් 8කින් සමන්විත ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපය සංවිධානය

කරන ලදී. කැනේඩියානු වෙළඳ පහසුකම් කාර්යාලයේ (TFO) සහයෝගීීතාවයෙන් වෙළඳපල අධ්‍යයනයක් සහ වෙළඳ සංචාරයක් සිදු කරන ලදී. මෙහිදී කැනේඩියානු ඩොලර් 84,375 ක ස්ථිර වෙළඳ ඇණවුම් සහ ආසන්න වශයෙන් වෙලද විමසීම් 100 ක් හිමි වී තිබිණි. 2016 වසර සඳහා ඇ.ඩො. මිලියනයක් සහ තවත් ඇ.ඩො. 200,000 ක ගිවිසුම් යටතේ මාළු, පොල් තෙල් සහ රස කැවිලි නිෂ්පාදන සඳහා කැනඩාවේ ප්‍රමුඛතම සුපිරි වෙළඳසැල් දාම 02 ක් සඳහා ශ්‍රී ලාංකිකයින්ට ඇණවුම් හිමිවිය.

2. පවත්නා වෙළඳපළ වැඩිදියුණු කිරීම

තායිලන්තය

2016 මාර්තු මස 10 වන දින ශ්‍රී ලංකා තායිලන්ත ව්‍යාපාරික සංසදයට පසුව තායිලන්ත අගමැතිවරයාගේ නායකත්වයෙන් යුතු තායි ව්‍යාපාරික දූත පිරිසක් සහභාගී වූ B2B රැස්වීම් වැඩසටහන සංවිධානය කරන ලදී. තායිලන්ත ව්‍යාපාරික සංසදය ශ්‍රී ලාංකික සමාගම් 200කගේ සහභාගීත්වයෙන් පවත්වන ලද අතර ශ්‍රී ලාංකික සමාගම් 175ක් තායිලන්ත සමාගම් 42ක් සමඟ B2B රැස්වීම්වලට සහභාගී වූහ.

ජර්මනිය

2016 මැයි 16වන දින ශ්‍රී ලංකා ජර්මනි ව්‍යාපාරික සංසදයට පසු B2B රැස්වීම් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා පෞද්ගලික සමාගම් 85, අමාත්‍යාංශ සහ අනෙකුත් රජයේ ආයතන සහ ජර්මානු සමාගම් 28ක් ඇතුළු 200කගේ සහභාගීත්වයෙන් ව්‍යාපාරික සංසදය පැවැත් වූ අතර ශ්‍රී ලාංකීය සමාගම් 85 සහ ජර්මානු සමාගම් 28 අතර B2B රැස්වීම් පැවැත්විණ. තාක්ෂණික මැදිහත්වීම් සඳහා SIEMENS ආයතනයේ සහයෝගය ලබා ගැනීම සඳහා මෙගා පොලිස් අමාත්‍යාංශය සහ SIEMENS අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. (Smart City යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.)

පුනර්ජනනීය බලශක්තිය භාවිතයෙන් විදුලිය ජනනය කිරීමේ ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හා ජර්මානු ආර්ථික කටයුතු ෆෙඩරල් අමාත්‍යාංශය සමඟ අත්සන් කරන ලදී.

අනෙකුත් වෙළඳාම් ප්‍රවර්ධන දූත මණ්ඩල

2016 පෙබරවාරි 5 සිට 7 දක්වා පැවති පාවහන් සම් භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා කෙන්යාව, ඉන්දියාව, ස්වීඩනය, දකුණු අප්‍රිකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිට ගැනුම්කරුවන් 21ක් සහභාගි විය. ආයුර්වේද එක්ස්පෝ 2016 ප්‍රදර්ශනය සඳහා ප්‍රංශයේ Guoyapi – Tropical සහ ඩුබායි Art of living Ayurveda Centre නියෝජනය කරමින් ගැනුම්කරුවන් 3ක් සහභාගී විය.

බාහිර නියෝජිතයින්

තායිලන්තය

2016 මැයි 25 සිට 27 දක්වා ගරු ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් තායිලන්තයේ වෙළඳාම හා ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් නිල සංචාරයක් සංවිධානය කරන ලදී. එහිදී 2016 ලෝක අපනයන සංවර්ධන සමුළුව සඳහා ආරාධිත කථිකයා වශයෙන් වික්‍රම් ක්‍රොමදිත් මහතාට ආරාධනා කරන ලදී. කුරුඳු පොතු තෙල් සහ පොල් වතුර අපනයනකරුවන්ගේ විස්තර තානාපති කාර්යාලය මගින් ඒවා සඳහා උනන්දුව දැක්වූ ව්‍යාපාරිකයන් වෙත යවන ලද අතර පුහුණු හා තාක්ෂණික සහය ලබා ගැනීම පිණිස සකස් කළ යෝජනා ද යවන ලදී.

ජර්මනිය හා ඔස්ට්‍රියාව

රාජ්‍ය නියෝජිත පිරිසකගේ සංචාරය හා සමගාමීව 05 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිසක් ජර්මනියේ ව්‍යාපාරිකයින් 200ක් සහභාගී වූ සමුළුවකට සහභාගී වීමේ අවස්ථාව අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.

මැලේසියාව

ශ්‍රී ලංකා ජනාධිපතිතුමාගේ මැලේසියානු සංචාරය හා සමගාමීව 2016 දෙසැම්බර් 14-16 දිනයන්හි දී ශ්‍රී ලාංකීය ව්‍යාපාරිකයින් 07 ක් මැලේසියානු ව්‍යාපාරිකයින් 300ට අධික පිරිසක් සහභාගී වූ ව්‍යාපාරික සංසදයකට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සහභාගී කරවන ලදී. එමෙන්ම ඔවුන්ට සුපිරි වෙළඳසැල් සමග ද සාකච්ඡා පැවැත්වීමේ අවස්ථාව ලැබිණ. මැලේසියාවේ විශාලතම විද්‍යුත් අලෙවිකරණ සේවා සැපයුම්කරුවෙකුට ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස ආරාධනා කිරීමේ හැකියාව ලැබුණු අතර මැලේසියානු වෙළඳ ප්‍රවර්ධන සංවිධානය වන MATRADE සමග අත්දැකීම් බෙදා ගැනීමේ අවස්ථාවද හිමි විය.

3. අපනයන වෙළඳපල සංවර්ධනය පිළිබඳ යෝජනා ක්‍රමය

මෙම යෝජනා ක්‍රමය යටතේ සමාගම් 2ක් සඳහා සහනයන් සලසන ලද අතර නව වෙළඳපල සංවර්ධන සහයෝගීතා යෝජනා ක්‍රමය යටතේ සමාගම් 12ක් ඇතුළු වෙළඳ නාම 3ක් සඳහා සහන ලබාදෙන ලදී. TJC Mango වෙළඳ නාමය සිංගප්පූරුවේ දී ද බයිරා බුරුසු මැලේසියාවේදී ද ආසියාව සඳහා මෘදුකාංග විසඳුම් (Broad Pack) ඉන්දියාවේදී ද යනාදී වශයෙන් ශ්‍රී ලාංකීය වෙළඳ නාම ප්‍රවර්ධනය සඳහා මෙමගින් අවස්ථාව ලබා දුනි. රු. මිලියන 8.1ක වටිනාකමකින් යුත් මූල්‍ය සහන මෙමගින් ලබා දෙන ලදී.

වෙළඳ පහසුකම් සහ වෙළඳ තොරතුරු

ගරු ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය තුමාගේ ප්‍රධානත්වයෙන් අපනයන ප්‍රජාව මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා "අපනයනකරුවන්ගේ සංසදය" පවත්වනු ලබන අතර ජ්‍යේෂ්ට රාජ්‍ය නිලධාරින් සහ පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් පසුගිය වසර සඳහා සංසද 3ක් සංවිධානය කරන ලදි.

මෙහි දී අපනයන ක්ෂේත්‍රයේ ගැටලු 67ක් සඳහා සුදුසු විසඳුම් ලබා දුන් අතර කාර්ය පටිපාටි, පරිපාලනමය, ප්‍රතිපත්ති සහ මූල්‍ය ආශ්‍රිත ගැටලු ඒ අතර විය.

ආනයන සහ අපනයන ක්‍රියා පටිපාටි පිළිබඳ පවත්වනු ලැබූ 139 වැනි සහ 140 වන පාඨමාලා සාර්ථකව අවසන් කළ 89 දෙනෙකුට සහතික පත් පිරිනමන ලදී. එමෙන්ම ජාත්‍යන්තර වෙළෙඳාමේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පාඨමාලාව සාර්ථකව නිම කළ 50 දෙනෙකුට ද සහතික පත්‍ර ප්‍රදානය කරන ලදි.

පාවහන් සහ සම් භාණ්ඩ ප්‍රදර්ශනය, ශ්‍රී ජයවර්ධන විශ්ව විද්‍යාලය විසින් පවත්වනු ලැබූ ව්‍යාපාරික ප්‍රදර්ශනය හා සායනය, ආයුර්වේද එක්ස්පෝ, රබර් සහ ප්ලාස්ටික් එක්ස්පෝ යනා දී දේශීය ප්‍රදර්ශන සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් තම සේවා දායකයන්ට ලබා දෙන සේවාවන් පිළිබඳ තොරතුරු බෙදා හැරීම සඳහා විශේෂ කුටි සංවිධානය කරන ලදි.

අපනයන ක්ෂේත්‍රය අරමුණු කර ගනිමින් ප්‍රධාන අපනයන නිෂ්පාදන සහ සේවා, අන්තර්ජාතික වෙළෙඳ ප්‍රදර්ශන සහ ආයෝජන අවස්ථා ආවරණය කෙරෙන පරිදි ව්‍යාපාරික සඟරාව සකස් කර එය වාණිජ මණ්ඩල, වෙළෙඳ සංගම්, ශ්‍රී ලංකාවේ සිටින විදේශීය රටවල දූත නියෝජිතයන් ඇතුළු විදේශීය රටවල සිටින ශ්‍රී ලංකා දූත පිරිස් 100කට අධික පිරිසකට බෙදා හරින ලදි.

අපනයන සංවර්ධන මණ්ඩලය " EDB News Letter" මාසික පුවත්පත සකස් කර සාමාජික අපනයනකරුවන්/ ව්‍යවසායකයන් අතර බෙදා දෙන ලදි .එහි දේශීය හා විදේශීය ව පවත්වනු ලබන වෙළෙඳ ප්‍රදර්ශන, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරනු ලබන වැඩ සටහන් සහ තවත් බොහෝ වැදගත් ලිපි රාශියක් අන්තර් ගත වේ.

තොරතුරු තාක්ෂණ සේවා

අපනයන සංවර්ධන මණ්ඩලීය වෙබ් අඩවිය සහ ඉලෙක්ට්‍රොනික වෙළෙඳපල (e-Market Place)

2003 වසරේ දී ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන සහ සේවා අන්තර්ජාලය හරහා ප්‍රවර්ධනය කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් බිහි දොර මගින් "e Market Place" සංකල්පය ක්‍රියාත්මක කරන ලදි.

මෙමගින් ශ්‍රී ලාංකීය ව්‍යවසායකයින්ට ජාත්‍යන්තර ගැණුම් කරුවන් සමඟ සම්බන්ධ වීමේ වේදිකාවක් සැපයෙන අතර විශේෂයෙන්ම තම නිෂ්පාදන සුරක්ෂිතව අලෙවි කර ගැනීමෙ හැකියාව ද පවතී. මෙම ඉලෙක්ට්‍රොනික වෙළෙඳපල ආරක්ෂිත මෘදුකාංගයකින් සන්නද්ධ කර ඇති හෙයින් මෙමගින් ලොව ඕනෑම තැනක සිට මිල දී ගැනීමේ හැකියාව පවතී. ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව, නෙදර්ලන්තය, ඉන්දියාව, රුසියාව, ජර්මනිය, චීනය, ප්‍රංශය, එක්සත් රාජධානිය, පිලිපීනය, රුමේනියාව සහ මැලේසියාව යනා දී රටවල් සමඟ ඇමරිකානු ඩොලර් 3509.85 ක වටිනාකමකින් යුතු වෙළෙඳ ගනුදෙනු 22 ක් පමණ මෙමගින් සිදු කර ඇත.

2016 ජුලි මස 21 වැනි දින සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 67ක් සඳහා අන්තර්ජලය මගින් සිදුවන අපරාධ, ආරක්ෂා විධි සහ ව්‍යාපාරික අවස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදි. මෙයට අමතරව අපනයන සංවර්ධන මණ්ඩලීය වෙබ් අඩවියේ ලිපි 47ක් සහ Facebook සමාජ ජාල පිටුවේ ලිපි 246ක් පල කරන ලදි.

2018.03.23
ප්‍රතිපත්ති හා උපාය මාර්ගික සැලසුම් අංශය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2016.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	එස්. එල්. එෆ්.ආර්.එස් 31.12.2016	එස්. එල්. එෆ්.ආර්.එස් 31.12.2015
වත්කම්		රු. ශත.	රු. ශත.
ජංගම නොවන වත්කම්			
ශුද්ධ දේපල පිරියත හා උපකරණ	(9)	70,955,617.17	79,849,346.39
සඳහන් නොකෙරුණු සමාගම් ආයෝජන	(10)	1,012,467,874.00	942,012,158.00
		1,083,423,491.17	1,021,861,504.39
වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම්	(11)	40,548,150.00	40,548,150.00
මුළු ජංගම නොවන වත්කම්		1,123,971,641.17	1,062,409,654.39
ජංගම වත්කම්			
තොග	(12)	1,840,628.54	1,843,501.62
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	(13)	157,757,770.55	143,919,667.87
අත්තිකාරම් හා ඉදිරි ගෙවීම්	(14)	17,297,453.45	38,192,036.96
මුදල් හා මුදල් සමාන දෑ	(15)	38,622,546.20	85,038,612.68
		215,518,398.74	268,993,819.13
මුළු වත්කම්		**1,339,490,039.91**	**1,331,403,473.52**
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධන සහ වෙන් කිරීම්			
ආධාර ලැබීම	(16)	10,014,284.00	10,014,284.00
වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය		1,114,175,562.99	1,092,316,061.15
මුළු හිමිකම්		1,124,189,846.99	1,102,330,345.15
ආධාර			
ආධාර ලැබීම් - වෙනත්	(17)	32,967,988.25	31,585,157.48
		32,967,988.25	31,585,157.48
ජංගම නොවන වගකීම්			
වෙන්කිරීම් හා අනිකුත් වගකීම්	(18)	30,489,828.08	29,184,142.24
පාරිතෝශික සඳහා වෙන්කිරීම්	(19)	88,057,017.00	93,193,267.00
		118,546,845.08	122,377,409.24
ජංගම වගකීම			
අනිකුත් ගෙවීම්	(20)	63,785,359.59	52,474,985.44
බැංකු අයිරාව	(21)	-	22,635,576.21
		63,785,359.59	75,110,561.65
මුළු හිමිකම් හා වගකීම්		**1,339,490,039.91**	**1,331,403,473.52**

මෙම මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්‍ෂ මණ්ඩලය වගකීම දරණු ලබයි. අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙනුවෙන් 2016.12. 31 දිනට අත්සන් කලේ,

....	....	....
ඉන්දිරා මල්වත්ත	රොහාන් අබේකෝන්	පී.කේ.සුමිත්‍රාරච්චි
සභාපතිනිය සහ ප්‍රධාන විධායක	අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික	මුදල් අධ්‍යක්ෂිකා

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් හා වියදම් ප්‍රකාශය

	සටහන	එස්. එල්. එෆ්. ආර්.එස් **31.12.2016** රු. ශත.	එස්. එල්. එෆ්. ආර්. එස් **31.12.2015** රු. ශත.
ආදායම			
ආදායම	(3)	467,499,501.27	560,293,096.48
අනෙකුත් ආදායම්	(4)	125,162,153.67	116,753,204.68
මුළු ආදායම		592,661,654.94	677,046,301.16
වියදම්			
අපනයන සංවර්ධන වියදම	(5)	(208,013,222.29)	(245,617,330.73)
පරිපාලන වියදම	(6)	(337,721,924.35)	(359,936,254.12)
මෙහෙයුම් වියදම් ඉක්මවූ ආදායම		46,926,508.30	71,492,716.31
මූල්‍ය වියදම්	(7)	(1,152,602.68)	(1,348,677.45)
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වියදම ඉක්මවූ අතිරික්තය		45,773,905.62	70,144,038.86
අනෙකුත් විස්තීරණ ආදායම්			
දේපල හා පිරියත උපලබ්ධියෙන් ලාභ/(අලාභ)	(8)	-	-
ආයු ගණක ලාභ/නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්මත		-	-
විදේශ කටයුතු මත මූල්‍ය ප්‍රකාශන පරිවර්තන සඳහා- -ලාභය/පාඩුව		-	-
මූල්‍ය වත්කම් විකිනීමෙන් ලාභ(පාඩු)		-	-
වර්ෂයේ අනිකුත් මුළු ආදායම		-	-
වර්ෂයේ මුළු ආදායම		**45,773,905.62**	**70,144,038.86**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2016.12.31 දිනට අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය

		රාජ්‍ය ආධාර	සමුච්චිත ලාභ	එකතුව
2014.12.31 දිනට ශේෂය		10,014,284.00	1,026,271,483.80	1,036,285,767.80
සාමාන්‍ය ක්‍රියා වලින් වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය		-	70,144,038.86	70,144,038.86
පෙර වර්ෂයේ ගැලපීම		-	(4,099,461.51)	(4,099,461.51)
2015.12.31 ශේෂය		10,014,284.00	1,092,316,061.15	1,102,330,345.15
සාමාන්‍ය ක්‍රියා වලින් වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය		-	45,773,905.62	45,773,905.62
පෙර වර්ෂයේ ගැලපීම්	(24)	-	(23,914,403.78)	(23,914,403.78)
2016.12.31 දිනට ශේෂය		**10,014,284.00**	**1,114,175,562.99**	**1,124,189,846.99**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2016.12.31 දිනට අවසන් වර්ෂය සඳහා - මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	2016	2015
		රු. ශත.	රු. ශත.
මෙහෙයුම් වලින් ලද මුදල් ප්‍රවාහය			
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලද වියදමට වැඩි ආදායම		45,773,906	70,144,039
ගැලපීම්			
ක්ෂයවීම්		14,443,692	13,347,223
ආයෝජන වලින් ලද ආදායම		(115,584,844)	(109,503,735)
පෙර වර්ෂය සඳහා ගැලපුම්		(23,957,483)	(4,099,462)
මූල්‍ය වියදම		367,361	364,397
රාජ්‍ය ලැබීම් සඳහා ක්‍රමක්ෂය		(4,124,053)	(3,323,500)
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්		5,211,847	19,909,697
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)		**(77,869,574)**	**(13,161,340)**
තොගය (වැඩිවීම)/අඩුවීම		2,873	(525,358)
ණය ගැති හා ලැබියයුතු දෑ (වැඩිවීම)/අඩුවීම		(13,838,103)	4,547,135
අත්තිකාරම් හා කලින් ගෙවම් (වැඩිවීම)/අඩුවීම		20,894,584	13,142,566
වෙන්කිරීම් හා වෙනත් ගෙවියයුතු දෑ වැඩිවීම/(අඩුවීම)		1,305,686	2,658,958
වෙනත් ගෙවියයුතු දෑ වැඩිවීම/ (අඩුවීම)		11,310,374	(10,755,471)
මෙහෙයුම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		**(58,194,160)**	**(4,093,510)**
මූල්‍ය වියදම් ගෙවීම්		(367,361)	(364,397)
පාරිතෝෂික ගෙවීම්		(10,348,097)	(11,090,706)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ගලායාම		**(68,909,618)**	**(15,548,612)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම්	9	(5,549,963)	(3,492,460)
ලාභාංශ ලැබීම්	4	42,859,381	54,097,923
පොලී ලැබීම්	4	2,269,747	1,984,462
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලාඑම		**39,579,166**	**52,589,924**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
රාජ්‍ය ආධාර ලැබීම්		5,549,963	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**5,549,963**	**-**
වර්ෂය තුල මුදල් හා මුදල් සමාන දෑ වැඩිවීම/අඩුවීම		(23,780,490)	37,041,312
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		62,403,036	25,361,724
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		**38,622,546**	**62,403,036**
මුදල් හා මුදල් සමානම දෑ විශ්ලේෂණය			
අතැති මුදල්	15	67,794	130,049
බැංකුවේ ඇති මුදල්	15	38,554,752	84,908,564
බැංකු අයිරා	21	-	(22,635,576)
		38,622,546	**62,403,036**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2016.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සටහන්

		එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2016 රු. ශත.	එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2015 රු. ශත.
(3)	**ආදායම**		
	රාජ්‍ය ලැබීම	364,450,037.49	462,770,000.00
	අපනයන සේවා ආදායම්	64,859,625.56	84,001,943.59
	පලාත් කාර්යාල ආදායම්	167,933.64	84,050.40
	අන්තර්ජාල ආදායම්	426,630.00	343,894.00
	විද්‍යුත් වෙළඳ ආදායම	709,721.18	458,859.79
	WEDF 2016 ආදායම	24,875,721.90	-
	එක්ස්පෝ 2012 ආදායම	-	1,000,000.00
	සම්මන්ත්‍රණ හා පාඨමාලා ගාස්තු	5,782,433.25	3,773,280.00
	වෙළඳ කුටි ආදායම - සම් භාණ්ඩ ප්‍රදර්ශනය 2016	4,380,827.25	6,539,247.70
	පොත් අලෙවිය	250,071.00	165,821.00
	අනෙකුත් ආදායම්	1,596,500.00	1,156,000.00
		467,499,501.27	**560,293,096.48**
(4)	**අනෙකුත් ආදායම්**		
	පොලී ආදායම්	2,269,747.27	1,984,461.65
	ආශ්‍රිත සමාගම් ලාභ	70,455,716.00	53,421,350.00
	ලාභාංශ	42,859,380.87	54,097,923.05
	අනිකුත් විවිධ ආදායම්	1,700,906.88	438,496.35
	ක්‍රමක්ෂය රාජ්‍ය ආධාර	4,124,053.01	3,323,500.00
	සේවක ණය පොලී	3,752,349.64	3,487,473.63
		125,162,153.67	**116,753,204.68**
(5)	**අපනයන සංවර්ධන වියදම්**		
	අපනයන සංවර්ධන වැඩසටහන්	61,337,586.37	66,607,024.74
	අපනයන වෙළඳ ප්‍රවර්ධන - විදේශ	76,493,976.99	121,312,624.90
	එක්ස්පෝ මිලානෝ 2015	-	13,331,528.67
	වෙළඳ නියෝජිත සහභාගිත්වය	-	500.00
	WEDF - 2016	40,014,026.29	-
	දේශීය වෙළඳ ප්‍රදර්ශන	9,674,043.85	9,211,475.65
	ප්‍රතිපත්ති හා සැලසුම්	2,001,362.60	3,692,527.17
	අපනයන වෙළඳ ප්‍රවර්ධන - දේශීය	5,056,077.07	3,751,492.77
	ප්‍රාදේශීය සංවර්ධන වියදම්	5,233,500.76	13,278,983.73
	වෙළඳ තොරතුරු හා සේවා වියදම්	3,934,690.92	4,220,741.78
	අන්තර්ජාල වියදම	3,958,664.26	7,219,584.70
	ඒකාබද්ධ කෘෂි ආදර්ශ ව්‍යාපෘති	128,642.67	2,982,206.62
	ශ්‍රී ලංකා කුරුඳු සන්නම් නිර්මාණය	180,650.51	8,640.00
		208,013,222.29	**245,617,330.73**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2016.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සටහන්

		එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2016 රු. ශත.	එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2015 රු. ශත.
(6)	**පරිපාලන වියදම්**		
	වැටුප් හා වේතන	123,917,943.23	127,498,333.84
	අතිකාල හා නිවාඩු දීමනා	7,362,820.56	7,404,712.84
	ප්‍රසාද දීමනා	2,623,012.50	2,778,337.50
	සේවක අර්ථ සාධක අරමුදල	16,261,980.65	16,708,117.65
	සේවක භාරකාර අරමුදල	3,252,520.45	3,350,700.01
	විශ්‍රාම වැටුප්	24,260.50	43,835.00
	පාරිතෝෂික දීමනා	5,211,847.00	19,909,697.25
	සුභසාධන	19,650,818.36	22,456,280.97
	බඳවාගැනීම් වියදම්	1,530,207.02	1,122,920.59
	සේවක පිරිවැය	3,752,349.64	3,487,473.63
	විදුලි ගාස්තු	20,238,022.91	18,024,563.57
	ජල ගාස්තු	2,217,775.87	802,563.06
	නීති හා වෙනත් වෘත්තීය ගාස්තු	422,340.00	650,864.00
	ප්‍රචාරණය	667,063.83	203,172.00
	ආරක්ෂක වියදම්	5,519,112.50	4,727,765.12
	විගණන ගාස්තු	700,000.00	600,000.00
	මුද්‍රණ වියදම්	214,102.00	393,974.78
	ගමන් වියදම්	12,493,161.26	13,025,028.12
	විනෝදාශ්වාද	208,895.04	405,266.84
	පොදු වියදම්	473,530.96	6,158,289.95
	අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු	1,363,111.00	608,327.00
	කාර්යාල උපකරණ නඩත්තුව	1,877,502.36	2,398,773.73
	ගෙවල් කුලී	63,833,098.44	65,301,327.83
	ඉන්ධන හා තෙල්	5,502,086.42	4,781,361.74
	වාහන නඩත්තු අලුත්වැඩියා	4,200,261.53	5,466,619.52
	පුද්ගලික කුලී	6,167,596.61	5,709,259.05
	සන්නිවේදන හා සාමාජික මුදල්	7,664,593.68	7,174,814.76
	ක්ෂය සඳහා වෙන් කිරීම්	14,443,691.73	13,347,222.77
	දේශීය පුහුණු වියදම්	1,196,520.33	854,417.53
	කාර්යාල අවශ්‍යතා	3,973,473.89	3,425,668.03
	විදේශීය පුහුණු වියදම්	758,224.08	1,116,565.44
		337,721,924.35	**359,936,254.12**

	එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2016 රු. ශත.	එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2015 රු. ශත.
(7) මුල්‍ය පිරිවැය		
පොලී වියදම්	367,361.20	364,397.02
මුද්දර ගාස්තු	82,418.92	73,772.50
මුල්‍ය වියදම්	702,822.56	910,507.93
	1,152,602.68	**1,348,677.45**

(8) මෝටර් රථ ප්‍රත්‍යාගණය

මණ්ඩලයට අයිති මෝටර් රථ ශ්‍රී ලංකා ඔටෝමොබයිල් සමාගම විසින් 2012.12.31 දිනට නැවත අගය කරන ලදි. වසර පහකට වරක් මෝටර් රථ වාහන නැවත අගය කිරීමට බලාපොරොත්තු වේ.

(9) දේපල යන්ත්‍ර හා උපකරණ

(9.1) පිරිවැය

ශේෂය 01/01/2015	වත්කම්	ශේෂය **01/01/2016**	එකතුකිරීම්	නැවත තක්සේරු කිරීම	ඉවත් කිරීම්	ශේෂය **31/12/2016**
99,364.00	ගෘහස්ත දුරකථන	99,364.00	-	-	-	99,364.00
49,550,000.00	මෝටර් රථ	75,110,000.00	233,100.00	-	-	75,343,100.00
31,941,213.02	පරිගණක	33,249,894.02	3,552,914.50	-	-	36,802,808.52
4,145,281.00	පරිගණක මෘදුකාංග	6,066,080.50	-	-	-	6,066,080.50
980,467.32	පරිගණක උපකරණ	1,006,347.32	47,547.13	-	-	1,053,894.45
-	කියොස්ක් පද්ධතිය	-	735,930.00	-	-	735,930.00
4,730,855.01	රූපවාහිනී උපකරණ	4,797,345.01	19,500.00	-	-	4,816,845.01
65,549.00	පී.ඒ.බී.එක්ස් උපකරණ	65,549.00	-	-	-	65,549.00
1,495,390.14	දුරකථන සවිකිරීම්	1,507,160.14	33,670.00	-	-	1,540,830.14
14,775,057.29	ලී බඩු සවිකිරීම	14,799,732.29	795,886.28	-	-	15,595,618.57
15,468,572.24	කාර්යාල උපකරණ	15,602,735.99	131,414.60	-	-	15,734,150.59
123,251,749.02		**152,304,208.27**	**5,549,962.51**	-	-	**157,854,170.78**

(9.2) ක්ෂය වෙන්කිරීම්

ශේෂය 01/01/2015	වත්කම	ශේෂය **01/01/2016**	වර්ෂය සඳහා ක්ෂය	ඉවත් කිරීම් සඳහා ක්ෂය වෙන් කිරීම්	ශේෂය **31/12/2016**
68,367.42	ගෘහස්ත දුරකථන	75,489.06	7,121.64	-	82,610.70
11,349,999.99	මෝටර් රථ	19,048,499.99	8,238,770.00	-	27,287,269.99
24,346,098.58	පරිගණක	27,200,981.93	3,144,429.61	-	30,345,411.54
1,978,284.77	පරිගණක මෘදුකාංග	2,711,589.07	971,124.75	-	3,682,713.82
341,899.27	පරිගණක උපකරණ	559,173.66	173,754.01	-	732,927.67
-	කියොස්ක් පද්ධතිය	-	12,265.50	-	12,265.50
3,302,935.56	රූපවාහිනී උපකරණ	3,525,047.67	228,761.11	-	3,753,808.78
30,713.57	පී.ඒ.බී.එක්ස් උපකරණ	34,197.11	6,554.90	-	40,752.01
1,341,124.01	දුරකථන සවිකිරීම	1,421,589.43	83,627.59	-	1,505,217.02
5,853,706.65	ලී බඩු සවිකිරීම	6,547,088.24	728,305.76	-	7,275,394.00
10,494,509.29	කාර්යාල උපකරණ	11,331,205.72	848,976.86	-	12,180,182.58
59,107,639.11		**72,454,861.88**	**14,443,691.73**	-	**86,898,553.61**

	ලියා හරින ලද වටිනාකම	**2016**	**2015**
123,251,749.02	පිරිවැය	157,854,170.78	152,304,208.27
(59,107,639.11)	සමුච්චිත ක්ෂය කිරීම්	(86,898,553.61)	(72,454,861.88)
64,144,109.91	ලියා හරින ලද වටිනාකම	**70,955,617.17**	**79,849,346.39**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2016.12.31 අවසන් වර්ෂය සඳහා
මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සටහන්

		එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2016 රු ශත.	එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2015 රු ශත.
(10)	**ආශ්‍රිත සමාගම් ආයෝජන - ලැයිස්තුගත නොවන**		
	ආශ්‍රිත සමාගම් ආයෝජන - ඩී.එච්.පී.එල්.	1,012,467,874.00	942,012,158.00
		1,012,467,874.00	**942,012,158.00**
(11)	**වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම්**		
	නිදහස් කළ හැකි වරණීය කොටස්	105,058,083.78	105,058,083.78
	සාමාන්‍ය කොටස්	58,312,483.62	58,312,483.62
	(-) හානිකරණ සඳහා වෙන් කිරීම්	(122,822,417.40)	(122,822,417.40)
		40,548,150.00	**40,548,150.00**
(12)	**තොගය**		
	ලිපිද්‍රව්‍ය	1,840,628.54	1,843,501.62
	ටයර් හා ටියුබ්	-	–
		1,840,628.54	**1,843,501.62**
(13)	**වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ**		
	අපනයනකරුවන්ගේ ණය	45,183,838.60	46,120,175.53
	(-) ණයගැති හානිකරණ වෙන් කිරීම්	(44,176,573.65)	(45,477,591.40)
	කාර්ය මණ්ඩල ණය	40,813,910.25	41,985,995.31
	(-) ගෙවිය යුතු සේවක පිරිවැය	(3,940,875.88)	(14,316,119.84)
	ලැබිය යුතු වැට්	104,676,878.80	104,676,878.80
	වෙනත් තැන්පතු	15,200,592.43	10,930,329.47
		157,757,770.55	**143,919,667.87**
(14)	**අත්තිකාරම් හා ගෙවීම්**		
	ගෙවීම්	4,289,831.97	15,599,232.10
	අත්තිකාරම්	6,350,095.44	5,719,704.56
	බැංකු සුරක්ෂිත	300,000.00	300,000.00
	සේවා තැන්පතු	1,307,260.00	1,062,550.30
	ආපසු ගෙවිය යුතු ආරක්ෂිත තැන්පතු	969,390.16	969,390.16
	අවලංගු චෙක්පත්	140,000.00	225,040.00
	කලින් ගෙවූ කාර්ය මණ්'ඩල වියදම්	3,940,875.88	14,316,119.84
		17,297,453.45	**38,192,036.96**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2016.12.31 අවසන් වර්ෂය සඳහා
මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සටහන්

		එස්.එල්.එෆ් ආර්.එස් 31.12.2016 රු ශත.	එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2015 රු ශත.
(15)	**මුදල් හා මුදල් සමාන දෑ**		
	ලංකා බැංකුව - මුදල් අයකැමි තැන්පත්	2,500.00	2,500.00
	ලංකා බැංකුව - ලේක් වීව් (306605)	32,293,112.53	-
	ලංකා බැංකුව - ලේක් වීව් (306606)	-	74,513,941.58
	ජාතික සංවර්ධන බැංකුව	1,017,863.61	4,463,266.71
	ලංකා බැංකුව - කෝපරේට් ශාඛාව	227,280.45	5,904,484.72
	ඩී. එෆ්. සී. සී. - කෝපරේට් ශාඛාව	4,998,890.00	-
	සම්පත් බැංකුව - මහනුවර	4,917.32	4,728.76
	සම්පත් බැංකුව - ගාල්ල	7,086.81	6,886.49
	ලංකා බැංකුව - අම්පාර	-	3,987.61
	ලංකා බැංකුව - හම්බන්තොට	-	1,903.61
	ලංකා බැංකුව බදුල්ල	-	4,385.80
	ලංකා බැංකුව - මන්නාරම	1,385.45	919.78
	සම්පත් බැංකුව- කුරුණෑගල	1,716.21	1,558.68
	අතැති මුදල්	67,793.82	130,048.94
		38,622,546.20	**85,038,612.68**
(16)	**රජයේ ලැබීම්**		
	රජයේ දායකය	7,904,002.00	7,904,002.00
	යූ.එන්.ඩී.පී. දායකය	2,110,282.00	2,110,282.00
		10,014,284.00	**10,014,284.00**
(17)	**රජයේ ලැබීම්**		
	රජයේ දායකය - මෝටර් රථ	38,793,100.00	38,560,000.00
	රජයේ දායකය - වෙනත්	5,316,862.51	-
	අයි.ටී.සී දායකය	12,716.35	12,716.35
	අපනයන ප්‍රවර්ධන ලේකම් කාර්යාලය	202,677.32	202,677.32
	(-) රජයේ ආධාර ක්‍රමක්ෂය	(11,357,367.93)	(7,190,236.19)
		32,967,988.25	**31,585,157.48**
(18)	**වෙනත් වගකීම් හා වෙන්කිරීම්**		
	ණය ආධාර ක්‍රම දායකත්වය	7,954,151.81	7,888,532.97
	ඌව පරණගම ආශ්‍රිත ගම්මාන	2,108,251.77	2,108,251.77
	අපනයනකරු දායකත්වය	23,712,791.00	24,678,355.00
	ඌව පරණගම පාලන ගිණුම	(10,403,683.00)	(10,403,683.00)
	ආපසු ගෙවිය යුතු තැන්පතු	7,118,316.50	4,912,685.50
		30,489,828.08	**29,184,142.24**
(19)	**පාරිතෝෂික සඳහා වෙන් කිරීම්**		
	ඉදිරියට ගෙන ආ ශේෂය	93,193,267.00	84,374,275.25
	වර්ෂය තුල කළ වෙන් කිරීම්	5,211,847.00	19,909,697.25

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2016.12.31 අවසන් වර්ෂය සඳහා
මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සටහන්

		එස්,එල්.එෆ් ආර්.එස් 31.12.2016 රු ශත.	එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2015 රු ශත.
	වර්ෂය තුල කළ ගෙවීම්	(10,348,097.00)	(11,090,705.50)
	ඉදිරියට ගෙන ආ ශේෂය	**88,057,017.00**	**93,193,267.00**
(20)	**වෙනත් ගෙවියයුතු දෑ**		
	ගෙවිය යුතු මුද්දර ගාස්තු	-	16,175.00
	ගෙවිය යුතු වැටුප්	33,422.30	152,054.87
	ගෙවිය යුතු විවිධ වියදම්	1,338.53	21,717.86
	ගෙවිය යුතු සේ. අ. අ. වියදම්	33,802,601.95	2,780,399.73
	ගෙවිය යුතු සේ.භා. අ. වියදම්	3,741.67	333,648.12
	විශ්‍රාම වැටුප් ගෙවීම්	-	(165.00)
	සේවක අවසාන ගෙවීම්	33,005.36	61,644.46
	ගෙවිය යුතු විගණන ගාස්තු	1,294,672.00	1,973,292.00
	නැවත ගෙවිය යුතු ආරක්ෂක තැන්පතු	2,500.00	2,500.00
	ගෙවිය යුතු රක්ෂණ	-	-
	නැවත ගෙවිය යුතු තැන්පතු- ටෙන්ඩ'ර	6,000.00	6,000.00
	ඉදිරිපත් නොකල චෙක්පත්	162,153.88	317,233.95
	වෙනත් උපචිත වියදම්	28,445,923.90	46,810,484.45
		63,785,359.59	**52,474,985.44**
(21)	**බැංකු අයිරාව**		
	ලංකා බැකුව - ලේක් වීව්	-	22,635,576.21
		-	**22,635,576.21**

(22) ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත 39 ට අනුව හිමිකම් කොටස් ආයෝජනය හානිකරණ පරීක්ෂා කරන ලදි. ඒ අනුව 01.01.2011 දිනට හානිකරණ වෙන් කිරීම නැවත ගැලපීම රු 31,698,150 කි.

(23) **(23.1)** **කාර්ය මණ්ඩල ණය**

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 39 ට අනුව 01.01.2013 දිනට පැවති කාර්ය මණ්ඩල ණය පවත්නා පොලී අනුපාතයට අනුව හානිකරණ පාඩු අඩුකොට අවකරණය කරන ලදි . ඒ අනුව ඉදිරියට කළ කාර්ය මණ්ඩල පිරිවැය සහ එස්.එල්.එෆ් ආ'ර්.එස් ගැලපීම් අගය රු: 16,060,711.67 ගිණුම්කරණ පොත්වල ගලපන ලදි.

(23.2) එස්.එල්.එෆ් ආ'ර.එස්.ගැලපීම් ගිණුමේ ශේෂය කාර්ය මණ්ඩල ණය ගිණුමෙන් අඩුකරන ලදි. ඒ අනුව කාර්ය මණ්ඩල ණය මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සාධාරණ අගයට පෙන්වා ඇත.

කාර්ය මණ්ඩල ණය	40,813,910.25
එස්,එල්.එෆ් ආර්.එස් ගැලපීම්	(3,940,875.88)
	36,873,034.37

(23.3) ඉහත ගැලපීමෙන් හටගත් ඉදිරියට කළ කාර්ය මණ්ඩල පිරිවැය ජංගම වත්කම් යටතේ පෙන්වා ඇත.

ඉදිරියට කළ කාර්ය මණ්ඩල පිරිවැය	3,940,875.88

(24) පෙර වර්ෂයේ ගැලපීම්

පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි හඳුනාගැනීම් සහ මිනුම් සම්බන්ධව සිදු වී ඇති වැරදි නිවැරදි කිරීම් වලට අදාළ ගැලපීම් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සිදුකර ඇත.

පෙර වර්ෂයේ වැරදිවල ස්වභාවය	මූල්‍ය ප්‍රකාශනවලට බලපාන අයිතමය	වටිනාකම (රු.)
උපචිත වියදම් අධි වෙන්කිරීම් ගැලපීම	අදාළ වියදම් ගිණුම	(12,634,898.54)
හිඟ සේ.භා.අ. 2006-2015	සේ.භා.අ. වියදම් ගිණුම	4,052,570.56
හිඟ සේ.අ.අ. 2006-2015	සේ.අ.අ. වියදම් ගිණුම	33,771,421.36
අපනයන ණය මත අඩමාන ණය අධි වෙන්කිරීම් ගැලපීම	බොල් ණය	(366,680.82)
සංවර්ධන වියදම් අධි වෙන්කිරීම් ගැලපීම	අදාළ වියදම් ගිණුම	(636,479.51)
ව්‍යාපෘති වියදම් අධි වෙන්කිරීම් ගැලපීම	අදාළ වියදම් ගිණුම	(311,595.62)
වෙනත් (ශුද්ධ)	අදාළ ලෙජර ගිණුම්	40,066.35
		23,914,403.78

(25) සම්බන්ධිත පාර්ශවයන් සමග ගනුදෙනු

සම්බන්ධිත පාර්ශවයන් සමග ගනුදෙනු ලෙස සලකනු ලබන්නේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී තම ආශ්‍රිත සමාගම වූ ඩිවලොප්මන්ට් හෝල්ඩින් (පුද්ගලික) සමාගමට කරනු ලබන ගෙවීම්ය. 2016 වසර තුළ සම්බන්ධිත පාර්ශවයන් සමග පහත ගනුදෙනු සිදුකර ඇත.

නම	ගනුදෙනුව	2016 (රු.)	2015 (රු.)
ඩිවලොප්මන්ට්	මාසික කුලිය	59,598,214.28	59,508,928.54
හෝල්ඩින්	වාහන ගාල් කිරීමේ ගාස්තු	384,000.03	380,857.19
(පුද්ගලික) සමාගම	ශ්‍රවණාගාර ගාස්තු	438,304.85	721,274.99
	ලාභාංශ ලැබීම්	36,244,971.00	36,244,971.00
		96,665,490.16	96,856,031.72

(26) අසම්භාව්‍ය වත්කම් සහ වගකීම්

පැහැර හරින්නන්ට එරෙහිව පවරා ඇති වත්මන් නඩු වලට අනුව, ආසන්න වශයෙන් රු.මිලියන 2.1 ක් එම සමාගම්වලින් අය කර ගැනීමට අපනයන සංවර්ධන මණ්ඩලයට හිමිකාරිත්වයක් පවතී.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීසීඑම්2/ඒඒ/ටීඩීබී/1/16/91 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 ඔක්තෝබර් 05 දින

සභාපති,

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාව මණ්ඩලයේ සභාපති වෙත 2017 අගෝස්තු 28 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

ගිණුම්කරණ ප්‍රමිතියක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අයිතමයක් වන අත්තිකාරම් ශේෂයට වත්කම් ඉවත් කිරීම් ගිණුමක බැර ශේෂය හිලව් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37

මණ්ඩලය විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව පවරන ලද නඩු වෙනුවෙන් අයකරගත යුතු මුදල ආසන්න වශයෙන් රු.2,100,000 ක් බවට මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය වත්කම් යටතේ හෙළිදරව් කර තිබුණද එම පාර්ශවයන් හා එකී පාර්ශවයන්ගෙන් අයවිය යුතු මුදල පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38

මණ්ඩලයේ වෙබ් අඩවිය සංවර්ධන කිරීම සඳහා වැය කරන ලද රු.5,128,000 ක මුදල අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

ඉන්ටර්ෂූ ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ අපනයනකරුවන්ගෙන් අය කළ ගාස්තුව ලෙජරයට අනුව රු.1,783,025 ක් වූ නමුත් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, එය රු.1,708,051 ක් වූයෙන් රු.74,974 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

	ගිණුම් විෂයය	වටිනාකම	ඉදිරිපත් නොකළ සාක්ෂි
		රු.	
(අ)	ප්‍රසාද දීමනා	2,623,013	භාණ්ඩාගාර අනුමැතිය හා ගණනය කිරීම් පිළිබඳ විස්තර.
(ආ)	ලැබිය යුතු ශේෂ	157,757,770	උපලේඛන හා කාල විශ්ලේෂණ.
(ඇ)	උපචිත වියදම්	28,445,924	
(ඈ)	අපනයන ප්‍රවර්ධන වැඩසටහන්	41,053,000	අධ්‍යක්ෂ මණ්ඩල තීරණ. අපනයනකරුවන් තෝරා ගැනීමේ පරිපාටි. ප්‍රතිපූර්ණ වියදම් ලැයිස්තු හා ලිපිගොනු.
(ඉ)	විදේශ ගමන් වියදම්	667,985	දීමනා ගණනය කිරීම්වල නිරවද්‍යතාව තහවුරු කරගැනීමට අවශ්‍ය ගුවන් ටිකට්පත් හා විදේශ ගමන් බලපත්.

2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

කොහු ආශ්‍රිත නිෂ්පාදනවල අගය වැඩිකිරීම සඳහා අනුග්‍රහය සැපයීමේ වැඩසටහන යටතේ මණ්ඩලය විසින් පෞද්ගලික සමාගමක් සමග 2014 ජූලි 27 දින එළඹි ගිවිසුම, 2015 ඔක්තෝබර් 26 දිනෙන් අවසන් වී තිබුණද එදිනෙන් පසුව රු.450,648 ක් ගෙවා තිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්
(අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 හා 1980 අංක 16 දරන සේවක භාරකාර අරමුදල් පනතේ 44 වගන්ති	සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායකත්වය ගණනය කිරීමේදී විශේෂ දීමනා, වෘත්තීය දීමනා, අන්තර් දීමනා හා අනුමත නොවූ විශේෂ ජීවන වියදම් දීමනා ඇතුළත් කිරීම හා ජීවන වියදම් දීමනාව ඇතුළත් නොකිරීම මත විගණනයට භාජනය වූ 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදලට රු.5.508,199 ක් හා සේවක භාරකාර අරමුදලට රු.659,375 ක් වැඩියෙන් ගෙවා තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 11.1 වගන්තිය	ගුවන් මගින් කරනු ලබන සියලුම ගමන් පිරිමැසුම් පන්තිය උපයෝගී කරගෙන යායුතු වුවත් මණ්ඩලයේ සභාපතිනිය හා විධායක අධ්‍යක්ෂ විසින් ව්‍යාපාරික පන්තියේ ප්‍රවේශ පත්‍ර ලබාගෙන තිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
මුදල් රෙගුලාසි 103(1)(ආ) හා 104(1)	2016 වර්ෂයේ දී සිදු වී ඇති වාහන අනතුරු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	
(i) 2005 මාර්තු 31 දිනැති අංක 08/2005 හා 2007 ජූනි 12 දිනැති අංක 15/2007 දරන චක්‍රලේඛ	2005 ජනවාරි 01 දින සිට බැංකු මගින් දේපළ ණය ලබා දීම කළ යුතු වුවත් මණ්ඩලය රජයේ ප්‍රදාන භාවිතා කරමින් මණ්ඩලය විසින්ම ණය ලබා දී තිබුණි. තවද, චක්‍රලේඛයේ උපදෙස් නොසලකා මුළු ණය මුදල සඳහා සියයට 4.2 ක ප්‍රතිශතයක් ලෙස පොලිය අය කර තිබූ අතර, මේ සඳහා

	භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ii) 2007 සැප්තැම්බර් 11 දිනැති අංක 21/2007 දරන චක්‍රලේඛය	විදේශ ගමන් සඳහා සහභාගී වීමේදී ලබා ගත යුතු අග්‍රාමාත්‍ය අනුමැතිය විදේශ වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වූ නිලධාරීන් සඳහා ලබා ගෙන නොතිබුණි.
(ඉ) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	සෑම මුදල් වර්ෂයකම දෙසැම්බර් 15 දිනට පෙර එම වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල පත්කර අවසන් කළ යුතු අතර ඊළඟ වර්ෂයේ මාර්තු 31 දින වන විට භාණ්ඩ සමීක්ෂණයේ කටයුතු අවසන් කර එම වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 ජූනි 28 දින වන විටත් 2016 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි.
(ඊ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 ඡේදය	කාර්තුවක් අවසන් වී දින 30 ක් තුළ රේඛීය අමාත්‍යාංශයට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට කාර්තුමය කාර්යසාධන වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි.
(උ) 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	මණ්ඩලයේ අවුරුදු 25 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින්ට රන් පවුම් ලබා දීම සඳහා 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.478,002 ක් වැය කර තිබුණද, සිය සේවකයින්ට ප්‍රතිලාභ ගෙවීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන භාවිතා කිරීමේදී භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.45,773,906 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.70,144,039 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.24,370,133 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රජයේ ප්‍රදාන රු.98,319,963 කින් අඩුවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලය පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ ශුද්ධ අලාභයක් හා 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩ ශුද්ධ ලාභයක් ඇති වී තිබුණු අතර එය වාර්ෂිකව උච්චාවචනය වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.154,726,961 ක් වූ දායකත්වය 2013 වර්ෂයේදී රු.287,157,318 ක් දක්වා එනම් සියයට 85 කින් දක්වා වර්ධනය වී තිබුණි. එහෙත් ඉන්පසු වර්ෂවලදී එය සුළු වශයෙන් පිරිහී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දායකත්වය රු.238,522,796 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුව අරමුණු පහත දැක්වේ.

(i) මහින්ද චින්තන - ඉදිරි දැක්ම අපේක්ෂිත ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ශ්‍රී ලංකාවේ අපනයන ආදායම වර්ෂ 2020 දී ඇ.ඩොලර් බිලියන 20 දක්වා ඉහළ නැංවීම.

(ii) යුරෝපා සංගමය සහ ඇමරිකා එක්සත් ජනපද වෙළඳපලවලට කරනු ලබන ශ්‍රී ලංකාවේ අපනයන ස්ථාවරව පවත්වා ගන්නා අතරතුර, අනෙකුත් විදේශ වෙළඳපලවලට කරනු ලබන අපනයන, සමස්ත අපනයන ඉපැයුමෙන් සියයට 50 කට වඩා වැඩි මට්ටමකට ඉහළ නැංවීම.

(iii) ශ්‍රී ලංකාවේ මුළු අපනයන ආදායමට සියයට 80 ක් පමණ දායක කරනු ලබන හඳුනාගත් ප්‍රමුඛ භාණ්ඩ හත පිළිබඳ විශේෂ අවධානය යොමුකරමින්, ඒවායේ අපනයන ආදායම සැලකිය යුතු ලෙස වැඩිකිරීම.

(iv) ඒකාබද්ධ අලෙවි සන්නිවේදන වැඩසටහන් තුළින්, ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ හා සේවා පිළිබඳව ධනාත්මක ප්‍රතිරූපයක් අන්තර්ජාතිකව ඇති කිරීම.

(v) අපනයන වෙළඳාමේ ප්‍රතිලාභ, එම ක්ෂේත්‍රයේ නියැලෙන සියලු පාර්ශවයන්ටම සහ දිවයිනේ සෑම පළාතකටම ගලා යාමට සැලැස්වීම.

(vi) සේවක ඵලදායීතාව සහ කැපවීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, ආයතනයේ මූලික වටිනාකම් මත ගොනු වූ විශිෂ්ඨ කණ්ඩායමක් මණ්ඩලය තුළ බිහි කිරීම.

ඉහත අරමුණු ක්‍රියාවට නැංවීම පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කාර්යසාධන වාර්තාව තුළ එක් එක් ක්‍රියාකාරකම්වලට අදාළ භෞතික ප්‍රගතිය සඳහන් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ නමුත් වර්ෂය තුළ ක්‍රියාත්මක නොකරන ලද වැය ක්ෂේත්‍ර 8 ක් යටතේ වූ ක්‍රියාකාරකම් 11 ක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා ප්‍රතිපාදිත මුදල රු.28,650,000 ක් විය. වැඩසටහනේ යෝග්‍යතාවය පිළිබඳ පූර්ව අවබෝධයකින් කටයුතු නොකිරීම, මණ්ඩලයේ අරමුණු හා සම්බන්ධ වැඩසටහන් තෝරා නොගැනීම, වැඩසටහන් හා සම්බන්ධවන ආයතන සහ පුද්ගලයන් සමඟ පූර්ව සාකච්ඡා නොපැවැත්වීම හා දැනුවත් නොකිරීම මෙම වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමට බලපෑ ප්‍රධාන හේතු විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කළ අපනයන ප්‍රවර්ධන වැඩසටහන්වල පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) අපනයනකරුවන්ගෙන් අයදුම්පත් කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීමේදී ඉංග්‍රීසි පුවත්පත්වල පමණක් පල කිරීම නිසා අපනයනකරුවන් වැඩි පිරිසකට එම ප්‍රදර්ශනවලට සහභාගි වීමට තිබූ අවස්ථාව සීමා වී තිබුණි.

(ii) අපනයනකරුවන් තෝරා ගැනීම සඳහා පත් කරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විධිමත්ව පත් කර නොතිබුණි.

(iii) අපනයනකරුවන් තෝරාගැනීමේදී ලකුණු ලබාදීමේ නිර්ණායක හා සීමාවන් පූර්වයෙන් නිර්ණය කර තිබුණද ඇතැම් අපනයනකරුවන්ට ලකුණු ලබා දීමේ පදනමක් නොවීය. එබැවින් අපනයනකරුවන්ට විදේශ වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(iv) වැඩි අපනයන ආදායම් උපයන මූල්‍ය දුෂ්කරතාවයන් නොමැති සමාගම් සඳහා වැඩි ලකුණු ලබා දෙමින් රජය මගින් මූල්‍යාධාර දීම සිදු කර තිබීමෙන් හා අඩු අපනයන ආදායම් උපයන සමාගම් සඳහා අඩු ලකුණුද ලබා දීම හේතුවෙන් අපනයන ප්‍රවර්ධනය කිරීමේ කාර්යය නිසියාකාරව ඉටු වී නොතිබුණි.

(v) විදේශ කොටස් අයිතිය ඇති සමාගම් සඳහා වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වීමේ අවස්ථාව ලබා දීම නිසා දේශීය අපනයනකරුවන්ට ලැබිය යුතු අවස්ථාව අහිමි වී තිබුණි.

(vi) විදේශ වෙළඳ ප්‍රදර්ශනවල වෙළඳකුටි ඉදිකිරීමේ හා ඉඩකඩ වෙන්කිරීමේ පිරිවැය වෙනුවෙන් මණ්ඩලයේ දායකත්වය සම්බන්ධයෙන් ඒකීය ප්‍රතිපත්තියක් නොතිබුණි.

(vii) විදේශ වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගීවීමේදී මණ්ඩලය අපනයනකරුවන් සමග ගිවිසුම්වලට ඇතුළත් නොවූ අවස්ථා නිරීක්ෂණය වූ අතර ඇතුළත්ව තිබූ ගිවිසුම් අඩුපාඩු සහිතවූ බැවින් වලංගුතාවයක් නොවිය. එබැවින් ගිවිසුම් කඩවූ අවස්ථා ඇතිවූ විට නීතිමය කටයුතු කිරීමේ අවස්ථාව ඇහිරී තිබුණි.

(viii) විදේශ වෙළඳ ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන් සහභාගී කරවීමේ අරමුණ සාක්ෂාත් කරගත්තේද යන්න හා අපනයන ප්‍රගතිය සම්බන්ධයෙන් මණ්ඩලය පසුවිපරම් කිරීමක් සිදු කර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා වැඩසටහන් සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීමේදී නිසි තොරතුරු ඇතුළත් නොකිරීම හා කාලානුරූපව කටයුතු නොකිරීම නිසා අවස්ථා දෙකකදී එකම කරුණ සඳහා පුවත්පත් දැන්වීම් 2 ක් පල කර තිබූ අතර, එහිදී පළමු පුවත්පත් දැන්වීම සඳහා වැය කළ රු.698,140 ක් අනාර්ථික වියදමක් වී තිබුණි.

(ආ) පෞද්ගලික සමාගම් 35 ක සාමාන්‍ය කොටස්වල කරන ලද ආයෝජන රු.58,312,484 ක් හා පෞද්ගලික සමාගම් 30 ක වරණීය කොටස්වල කරන ලද ආයෝජන රු.105,058,084 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද සමාගම් නාම ලේඛනයේ ලියාපදිංචි වී නොමැති සමාගම්, සමාගම් නාම ලේඛනයෙන් නම කපා හැර ඇති සමාගම් හා විසුරුවා හැර ඇති සමාගම් ද ඊට ඇතුළත් කර තිබුණි. කාලානුරූපව ආයෝජන සමාලෝචනය කර ඇතිවිය හැකි ප්‍රාග්ධන අලාභයන් වලක්වා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

තවද මෙම ආයෝජනයන් සඳහා 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එකම අගයක් එනම් රු.122,822,417 ක් හානිකරණ ප්‍රතිපාදන ලෙස වෙන්කර තිබුණු අතර ආයෝජන සමාලෝචනයට ලක්කර හානිකරණ ප්‍රතිපාදන සඳහා ගැලපීම් කර නොතිබුණි.

(ඇ) අනුමත වාර්ෂික අයවැය ලේඛනයේ ඇතුළත් නොවූ සංවර්ධන කාර්යයන් වෙනුවෙන් වර්ෂය තුළ රු.17,983,900 ක් වැය කර තිබුණි.

(ඈ) අභ්‍යන්තර විගණන ඒකකය විසින් සමාලෝචිත වර්ෂයේදී හා පෙර වර්ෂයේදී විගණන විමසුම් 2 ක් නිකුත් කර තිබූ නමුත් එම විමසුම්වලින් කළමනාකරණයට පෙන්වා දුන් ක්‍රියාත්මක කළ යුතු නිර්දේශයන් මණ්ඩලය ක්‍රියාත්මක කළ බවට ප්‍රධාන අභ්‍යන්තර විගණකට වාර්තා කර නොතිබුණි.

4.3 ආර්ථික නොවූ ගනුදෙනු

අපනයනකරුවන් තෝරා ගැනීම සඳහා කමිටු දෙකක් පත් කර තිබූ අතර කමිටු දෙකම එකම කාර්යභාරය සිදුකර තිබූ බැවින් දෙවන කමිටුවට ගෙවූ රු.265,000 ක මුදල ඵලදායී වී නොතිබුණි.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

කුරුඳු නිෂ්පාදනයන්හි අගය එකතු කිරීමේ අනුකූලතාවය උසස් කිරීම, ඵලදායී ධාරිතාවය හා තරඟකාරීත්වය වැඩි කිරීමේ අරමුණින් 2013 අයවැය යෝජනා මගින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හරහා වැය කිරීමට රු.28,500,000 ක මුදලක් වෙන් කර තිබුණද නිසි කාල රාමුව තුළ කටයුතු නොකිරීම නිසා එම මුදල මණ්ඩලයට නොලැබිණි. පසුව මණ්ඩලයට ලැබෙන වාර්ෂික ප්‍රතිපාදනවලින් කුරුඳු පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවක් ප්‍රසම්පාදන ක්‍රියාවලයකින් තොරව රු.26,373,010 කට පෞද්ගලික සමාගමකට පිරිනමා තිබුණද මධ්‍යස්ථානය ඉදිකරන ඉඩමේ අයිතිය මණ්ඩලයට පවරා ගෙන නොතිබුණි. මණ්ඩලය හා කොන්ත්‍රාත්කරු අතර ඇති කර ගෙන තිබූ ගිවිසුමේ 2.2 වගන්තිය අනුව 2013 නොවැම්බර් 01 දිනෙන් ආරම්භ වන වසර 3 ක් ඇතුළත මෙම මධ්‍යස්ථානය නිම කර මණ්ඩලයට භාර දිය යුතු වුවත් 2017 සැප්තැම්බර් 29 දින වන විටත් මණ්ඩලය මධ්‍යස්ථානය භාර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වර්තමානය වන විට එම සමාගම ගාස්තු අයකර කුරුඳු සම්බන්ධ පුහුණු පාඨමාලා පවත්වන බව නිරීක්ෂණය විය.

තවද මණ්ඩලය විසින් මධ්‍යස්ථානය සඳහා වැය කළ මුදල ප්‍රාග්ධනිත නොකර අයභාර වියදමක් ලෙස හඳුනා ගෙන තිබුණ අතර කොන්ත්‍රාත් සමාගමේ ගිණුම්වල මෙම වියදම මණ්ඩලයෙන් ලැබුණු ප්‍රදානයක් ලෙසද ගොඩනැගිල්ල වත්කමක් වශයෙන්ද ගිණුම්ගත කර තිබුණි. කුරුඳු පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමේ සම්බන්ධීකරණ නිලධාරිනිය වශයෙන් කටයුතු කළ මණ්ඩලයේ කෘෂි අපනයන අංශයේ වත්මන් අධ්‍යක්ෂ 2016 මැයි 30 දින සිට Cinnamon Training Academy

(pvt) Limited හි අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන බව නිරීක්ෂණය වූ අතර මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 අනුව 2016 මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

4.5 හඳුනා ගන්නා ලද පාඩු

ජර්මනියේ පැවැති ඉන්ටර් ෂූ ප්‍රදර්ශනය සඳහා සහභාගී වන අපනයනකරුවන් පිළිබඳව නිශ්චිතව තහවුරු කර නොගැනීම නිසා සහභාගී නොවූ අපනයනකරුවකු වෙනුවෙන් මණ්ඩලය දැරූ අමතර වියදම රු.294,621 ක් විය.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 මාර්තු වන විට මණ්ඩලයේ සේවයේ නියුතු නිලධාරීන් 209 දෙනාගෙන් 150 කට රාජකාරි පැවරීම සිදු කර නොතිබුණි. රාජකාරි පැවරීම් කර තිබූ නිලධාරීන් 59 දෙනාගෙන් එක් නිලධාරියකුට පමණක් සභාපතිගේ අත්සනින් රාජකාරි පවරා තිබුණ අතර අංශ ප්‍රධානීන් විසින් පවරා තිබූ සමහර රාජකාරි පැවරීම් අත්සන් කර නොතිබුණි. එක් එක් නිලධාරියාගේ රැකියා විස්තරය අනුව වගකීම පැවරෙන පරිදි රාජකාරි පැවරීම සිදු කර නොතිබුණු බැවින් නිලධාරියා පිළිබඳ නිසි ඇගයීමක් කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) අධ්‍යක්ෂ (මානව සම්පත්), අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) හා අධ්‍යක්ෂ (ප්‍රාදේශීය සංවර්ධන) තනතුරු සඳහා බඳවා ගැනීම පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මූලික සුදුසුකම් පරීක්ෂාව සඳහා වූ කමිටුවක් විසින් අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කර තිබුණද එම වාර්තා අත්සන් කර නොතිබුණි. මූලික සුදුසුකම් පරීක්ෂා කළ කමිටුවට බඳවා ගැනීමේ පටිපාටියේ දක්වා ඇති සුදුසුකම් පිළිබඳව අවබෝධයක් නොමැතිව තිබියදී හා එම කමිටුවට අයදුම්කරුවන් සුදුසුද නැද්ද යන්න තීරණය කිරීමට බලතල ලබා දී නොමැතිව තිබියදී අයදුම්කරුවන් සුදුසුද නැද්ද යන්න තීරණය කර තිබුණි. මෙම වාර්තාව අනුව නුසුදුසු අයදුම්කරුවන් සුදුසු ලෙස නම් කර තිබුණි.

(ii) මේ සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල 2 ක් නම් කර තිබුණ ද එම කමිටුවල සාමාජිකයින් විධිමත්ව පත්කර නොතිබුණි. තවද සම්මුඛ පරීක්ෂණ වාර්තා එකක් පමණක් කළමනාකරණයට ඉදිරිපත් කර තිබූ බැවින් එක් කමිටුවක් අක්‍රිය තත්ත්වයේ තිබුණි. මූලික සුදුසුකම් පරීක්ෂා කළ කමිටු වාර්තාව අනුව

නුසුදුසු අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුසු අයදුම්කරුවන් වශයෙන් නම් කර තිබුණි.

(iii) බඳවා ගැනීමේ පටිපාටිය අනුව අධ්‍යක්ෂ (මානව සම්පත්) තනතුර සඳහා සුදුසුකම් ලැබීමට බාහිර අයදුම්කරුවකුට පිළිගත් උපාධියක්, අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම සහ එම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් තිබිය යුතුය. එහෙත් එම සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණු බාහිර අයදුම්කරුවකු ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 6.1.3 වගන්තියේ විධිවිධානවලට පටහැනිව එම තනතුර පුරප්පාඩුවීමට මාසයකට පෙර බඳවාගෙන තිබුණි

(iv) මණ්ඩලයේ අනුමත බඳවාගැනීමේ හා උසස්කිරීමේ පටිපාටිය අනුව අධ්‍යක්ෂ (ප්‍රාදේශීය සංවර්ධන) තනතුර සඳහා බාහිර අයදුම්කරුවකු පිළිගත් විශ්වවිද්‍යාලයක පශ්චාත් උපාධියක් සමග වසර 15 ක කළමනාකරණ තනතුරක පළපුරුද්ද සපුරා තිබිය යුතු වුවත් එම සුදුසුකම් නොලැබූ අයදුම්කරුවකු බඳවා ගෙන තිබුණි.

(v) ඉහත තනතුරු දෙක සඳහා සුදුසුකම් අනුව ශ්‍රේණිගත කිරීමේදී අභ්‍යන්තර අයදුම්කරුවන් සුදුසුකම් ලබා තිබුණද, එම නිලධාරීන්ට මෙම තනතුරුවලට පත් වීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

(vi) මණ්ඩලයේ අනුමත බඳවාගැනීමේ හා උසස්කිරීමේ පටිපාටිය අනුව අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) තනතුරට අභ්‍යන්තරිකව බඳවා ගන්නේ නම් පශ්චාත් උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ MM 1.1 කාණ්ඩයේ පළමු ශ්‍රේණියේ තනතුරක වසර 5ක පළපුරුද්දක් ලබා තිබිය යුතු වුවත් එවැනි පළපුරුද්දක් නොතිබූ අලෙවි සංවර්ධන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස සේවය කළ නිලධාරිනියකට සම්මුඛ පරීක්ෂණයකින් තොරව එම පත්වීම ලබාදී තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් අදාළ ක්ෂේත්‍රයේ යන්න ඉවත් කරමින් නිලධාරීන් බඳවා ගැනීම සිදුකර තිබූ අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඇ) අපනයන ප්‍රවර්ධන නිලධාරි, පරිපාලන නිලධාරි, සංවර්ධන නිලධාරි, ගිණුම් නිලධාරි තනතුරු ඇතුළුව තවත් තනතුරු 10 ක පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අපනයන ප්‍රවර්ධන නිලධාරි තනතුරට උසස් කිරීම සඳහා පැවැත්වූ ලිඛිත විභාගයේ භාෂා ප්‍රවීනතාව හා විෂය දැනුම යන විෂයයන් දෙකෙන් මණ්ඩලයේ එක් නිලධාරිණියක් නිදහස් කර එම තනතුරට හා සහකාර අධ්‍යක්ෂවරු 09 ක් බඳවා ගැනීමට සංශෝධනය කළ බඳවා ගැනීමේ පරිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ii) සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2016 අගෝස්තු 21 දින පැවැත් වූ විභාගයේ ප්‍රතිඵල මත බාහිර අයදුම්කරුවන් 5 ක් හා අභ්‍යන්තර අයදුම්කරුවන් 4 ක් බඳවා ගෙන තිබුණි. විෂයයන් 3 කින් සමන්විත මෙම විභාගයේ ඉංග්‍රීසි විෂයය සඳහා ලබා දුන් කාලය ප්‍රමාණවත් නොවන බව සඳහන් කරමින් අභ්‍යන්තර අයදුම්කරුවන් කරන ලද ඉල්ලීමකට අනුව ඉංග්‍රීසි විෂයයට පමණක් නැවත විභාගය පවත්වා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 28 දින විගණකාධිපතිට ඉදිරිපත් කර තිබුණ ද ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය හා ප්‍රසම්පාදන සැලැස්ම යන කරුණු මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මේ අඩංගු එක් එක් ක්‍රියාකාරකම් සඳහා ආරම්භ කිරීමට හා අවසන් කිරීමට අපේක්ෂිත දිනය, නිම කිරීමට අපේක්ෂිත භෞතික ප්‍රමාණය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

(ඇ) 2015 ක්‍රියාකාරී සැලැස්මෙහි රු.3,100,000 ක් ප්‍රතිපාදන වෙන් කරන ලද එහෙත් ක්‍රියාවට නැංවීම 2016 වසරට කල්දමන ලද වැඩසටහන් 4 ක් නිරීක්ෂණය වූවද එම වැඩසටහන් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි වැය ක්ෂේත්‍ර 08 ක් යටතේ රු.20,200,000 ක ප්‍රතිපාදන සලසමින් ක්‍රියාවට නංවන ලද, එහෙත් එම වර්ෂය තුළදීම සම්පූර්ණයෙන් නිම කිරීමට අපොහොසත් වූ ක්‍රියාකාරකම් 11 ක් පිළිබඳ ඉතිරි වැඩ කොටස් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ ප්‍රතිපාදන සලසමින් ක්‍රියාවට නංවන ලද නමුත් එම වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කිරීමට අපොහොසත් වූ ක්‍රියාකාරකම් 07 ක් 2017 වර්ෂයට ඉදිරියට ගෙන ගොස් තිබුණි. එහෙත් මෙය තහවුරු කර ගැනීම සඳහා 2017 ක්‍රියාකාරී සැලැස්ම 2017 ජුනි 28 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

5.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

මණ්ඩලය විසින් වාර්ෂිකව පැවැත්විය යුතු ජනාධිපති අපනයන සම්මාන උළෙල 2010 සිට 2013 දක්වා වර්ෂ වෙනුවෙන් 2015 වර්ෂයේදී ද 2014 හා 2015 වර්ෂ වෙනුවෙන් 2016 වර්ෂයේදී ද පවත්වා තිබුණි. 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මෙම උළෙල සඳහා රු.5,800,000 ක් වැයකර තිබූ අතර අවම පිරිවැයක් යටතේ සිද්ධි කළමනාකරණ සමාගමක් තෝරා ගැනීමේදී සිදු වී තිබූ පාඩුව රු.468,250 ක් විය.

5.4 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ එක් එක් වැය ක්ෂේත්‍රයන්හි සංවර්ධන කාර්යයන් සම්බන්ධයෙන් කළ නියැදි පරීක්ෂාවට අනුව අයවැයගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම සැසඳීමේ දී අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා රු.6,519,000ක් වැය කර තිබුණි. එසේම පළතුරු හා එළවළු, ඉලෙක්ට්‍රොනික් සහ යන්ත්‍ර, ඉදිකිරීම් හා සෞඛ්‍ය සේවා, අලෙවි/වෙළඳපල සංවර්ධන හා ICT/BMP යනාදි වැය ක්ෂේත්‍රයන් අතර සියයට 11 සිට 118 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන චක්‍රලේඛයේ 5.2.1 ඡේදය අනුව හා 1971 අංක 38 දරන මුදල් පනතේ 8 (3) වගන්තිය පරිදි මෙහෙයුම් කටයුතු මගින් ජනිත කිරීමට අපේක්ෂිත ආදායම් හා වියදම් යන දෙවර්ගයම සඳහා අපේක්ෂිත ප්‍රාග්ධන හා අයභාර අගයන් ඇතුළත් කර වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කළ යුතු වුවද 2016 වර්ෂය සඳහා මණ්ඩලය විසින් පිළියෙල කරන ලද අයවැය ලේඛනය තුළ ඇතුළත් කර තිබුණේ අපේක්ෂිත වියදම් පමණි.

(ඇ) ඉහත චක්‍රලේඛයේ 5.2.5 ඡේදය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 8(4) වගන්තිය පරිදි අනුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමතකළ අයවැය ලේඛනය වහාම රේඛීය අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණු අතර විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ භාණ්ඩාගාර අනුමැතිය ලද අයවැය ලේඛනය නොව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ අයවැය ලේඛනය විය.

5.5 නොවිසඳී ඇති විගණන ඡේද

පසුගිය විගණන වාර්තාවලින් පෙන්වා දී ඇති නමුත්, ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු විගණන ඡේද පහත දැක්වේ.

2015 වර්ෂය

(අ) ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන අරමුදලින් ලබා දුන් රු.5,000,000 ක් වූ ණය මුදල නිරවුල් කර නොතිබුණි.

(ආ) 2013 මාර්තු 27 දින පෝලන්තයේ පැවැත් වූ ව්‍යාපාරික රැස්වීමක් සඳහා සහභාගී වූ නිලධාරීන්ගේ වියදම් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයට ගෙවන ලද මුදලින් රු.127,465 ක් නිරවුල් කර නොතිබුණි.

(ඇ) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 23(1) වගන්තියට පටහැනිව පත් කර තිබූ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ සඳහා 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වැටුප් හා දීමනා ලෙස රු.4,076,773 ක්, රාජකාරී හා පෞද්ගලික ගමන් සඳහා ලබාදී තිබූ වාහනයේ කුලී ලෙස රු.6,270,670 ක් හා විදේශ ගමන් සඳහා දීමනා හා ගමන් ගාස්තු ලෙස රු.2,122,770 ක් වශයෙන් එකතුව රු.12,470,213 ක් විධිමත් අධිකාර බලයකින් තොරව ගෙවා තිබුණි.

(ඈ) 2012 ජුනි 08 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝගය හා භාණ්ඩාගාර උපදෙස්වලට අනුකූලව කටයුතු නොකර, 2015 දෙසැම්බර් 31 දක්වා වාහන කුලියට ගෙන රු.11,703,560 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ඉ) 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ 2 (1) හා 13 (1), (2) වගන්ති අනුව 1992 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ වර්ෂ 23ක කාලපරිච්ඡේදය තුළදී අපනයන සංවර්ධන වැඩසටහන් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික සංවර්ධන සභාව රැස්වී නොතිබුණ අතර අපනයන සංවර්ධන අරමුදල පිහිටුවා නොතිබුණි.

(ඊ) එක්ස්පෝ මිලානෝ වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වූ නිලධාරීන් දෙදෙනෙකුට අග්‍රාමාත්‍ය අනුමැතිය ඉක්මවා රටෙන් බැහැරව සිටි කාලය සඳහා රු.605,803 ක් ගෙවා තිබුණි.

(උ) 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව පසුගිය වසර 4 ක් තුළ වෘත්තිය දීමනාව රු.2,182,894 ක්, විශේෂ ජීවන වියදම් දීමනාව රු.18,284,887 ක් හා ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා රු.12,458,798 ක් වැය කර තිබුණි.

(ඌ) 2015 මැයි 01 සිට 2015 ඔක්තෝබර් 31 දක්වා ඉතාලියේ මිලානෝහි පැවැත්වූ එක්ස්පෝ මිලානෝ ප්‍රදර්ශනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව රු.4,440,336 ක් වැඩිපුර වැය කර තිබුණ අතර කැබිනට් මණ්ඩල අනුමැතිය නොමැතිව පත් කර තිබූ එක්ස්පෝ කොමසාරිස් ජනරාල්වරයාගේ ක්‍රියා කලාපය මත ශ්‍රී ලංකාවට අහිමි වූ රු. 12,960,000 මුදල එම නිලධාරියාගෙන් අය කර ගෙන නොතිබුණි.

(එ) අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව රු.5,040,000 ක මුදලක් එක්ස්පෝ ශ්‍රී ලංකා දිනය වෙනුවෙන් වෙන්කර තිබියදීත් මණ්ඩලයේ සභාපති සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් එම දිනය වෙනුවෙන් සහභාගී වීමට රු.1,079,688 ක් වැය කර තිබුණි.

(ඒ) එක්ස්පෝ ප්‍රදර්ශනයට පත් කර තිබූ මණ්ඩලයේ නිලධාරීන්ට 2015 මැයි 15 දිනැති අංක MF01/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 04(ඩී) වගන්තියට පටහැනිව විදේශ ගමන් දීමනා සඳහා රු.3,770,640 ක් ගෙවා තිබුණි.

(ඔ) 1971 අංක 38 දරන මුදල් පනතේ 25 වගන්තිය, 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව අනුමැතියකින් තොරව සේවක ණය අරමුදලක්

පිහිටු වීමට හා ඊට මාසිකව සියයට 7.2 ක පොලියක් බැර කිරීමට 2015 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රදාන රු.2,567,531 ක් භාවිතා කර තිබුණි.

(ඕ) 2015 වර්ෂයේ විගණන වාර්තාවෙන් හඳුනාගන්නා ලද පාඩු රු.1,918,314 ක් පෙන්වා දුන්නද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2014 වර්ෂය

(අ) දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවට අයත් ගොඩනැගිල්ලක මණ්ඩලයේ එක් ගබඩාවක් පවත්වා ගෙන යනු ලබන පරිශ්‍රයේ කොටසක් උප බදු දී තිබුණු අතර ඒ සඳහා උප බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ බලතල හා කර්තව්‍යයන්ට පටහැනිව 2014 වර්ෂයේදී රු.4,020,848 ක වියදම් දරා තිබුණි.

(ඇ) 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ 12(ට) වගන්තිය අනුව මණ්ඩලය විසින් 1988 වර්ෂයේ සිට පෞද්ගලික සමාගම්වල කර තිබුණු රු.929,548,150 ක් වූ ආයෝජන සඳහා මුදල් අමාත්‍යවරයාගෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ ආරක්ෂක සේවයේ රාජකාරී කළ බවට ව්‍යාජ අත්සන් යොදා ලබා ගත් රු.226,530 ක වැටුප් ආපසු අය කර ගෙන නොතිබුණි.

(ඉ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මණ්ඩලයට අයත් වාහන 5 ක් සහ නිලධාරීන් 4 දෙනෙකු රේඛීය අමාත්‍යාංශයේ සේවයට යොදවා 2014 වර්ෂයේදී වාහන නඩත්තු වියදම්, කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ලෙස රු.2,824,256 ක් මණ්ඩලය විසින් දරා තිබුණි.

2013 වර්ෂය

(අ) ජාතික සවිය වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගෙවිය යුතු ලෙස දක්වා තිබූ රු.1,009,740 ක් එම කාර්යාලයෙන් තහවුරු කර ගැනීමකින් තොරව සහ විධිමත් අනුමැතියකින් තොරව ආදායමට බැර කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 3.5 වගන්තියට පටහැනිව යතුරුපැදි ණය හා ආපදා ණය දීමේදී මාසික අඩු කිරීම්වල එකතුවේ සීමාව මාසික වැටුපෙන් සියයට 50 ක් ලෙස සලකා තිබුණි.

(ඇ) ඉන්දියාවේ චෙන්නායි නුවර 2004 සිට 2009 කාලපරිච්ඡේදය තුළ මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබූ ශ්‍රී ලංකා වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳසැල් 5 කින් අය විය යුතු හිඟ කුලී හා විදුලි ගාස්තු රු.7,049,858 ක් 2016 අගෝස්තු 15 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

2012 වර්ෂය

"හම්බන්තොට බටඅත" කර්මාන්ත වැඩසටහනේ සම්භාණ්ඩ කර්මාන්ත ව්‍යාපෘතිය සඳහා රු.1,000,000 ක් ආයෝජනය කර ස්ථාපිත කළ පුද්ගලික සමාගමේ කටයුතු ආරම්භ කිරීම අත්හැර දමා තිබුණු බැවින්, ආයෝජනය කළ මුදල් මණ්ඩලයට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ)	ආයෝජන පාලනය	නිසි අනුමැතිය ලබා නොගැනීම හා පසු විපරම් නොකිරීම.
(ආ)	ණය පාලනය	අපනයන සමාගම් සමග ගිවිසුම් ඇති කර නොගැනීම හා ණය හා පොලිය අය කර ගැනීමට කටයුතු නොකිරීම.
(ඇ)	විශේෂ ව්‍යාපෘති පාලනය	මණ්ඩලයේ අරමුණුවලට පටහැනිව ව්‍යාපෘති ආරම්භ කිරීම හා ඉලක්කගත අරමුණු සපුරා ගැනීමකින් තොරව අතහැර දැමීම.
(ඈ)	අයවැය පාලනය	අයවැයගත විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා අයවැය ගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ඉදිරිපත් නොකිරීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති